ශ්‍රී ලංකා දේශීය ආදායම්
இலங்கை உள்நாட்டு இறைவரி
Sri Lanka Inland Revenue

ආදායම් වාර්තාව, උපලේඛන සහ වත්කම් හා බැරකම් ප්‍රකාශය පිරවීම සඳහා උපදෙස් මාලාව

පුද්ගලයින්

තක්සේරු වර්ෂය

2025/2026

මෙම උපදෙස් මාලාව

අ. පොදු උපදෙස්
ආ. වාර්තා ආකෘතිය සම්පූර්ණ කිරීමට උපදෙස්
ඇ. වත්කම් හා බැරකම් ප්‍රකාශය සම්පූර්ණ කිරීමට උපදෙස්
වලින් සමන්විත වේ.

අ. පොදු උපදෙස්

1. මෙම ලේඛන කට්ටලය කොටස් දෙකකින් සමන්විත වේ.
    I. වාර්තා ආකෘතිය
        (i) ආදායම් වාර්තාව
        (ii) ආදායම් වාර්තාව - උපලේඛන
    II. වත්කම් හා බැරකම් ප්‍රකාශය (ව/බැ)

සෑම බදු ගෙවන පුද්ගලයෙකු විසින්ම වාර්තාව (ආදායම් වාර්තාව සහ උපලේඛන) සහ වත්කම් හා බැරකම් ප්‍රකාශය සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.

ගොනු කිරීමේ ක්‍රමවේදය

2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 113 (1ආ) වගන්තිය ප්‍රකාරව 2023 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන තක්සේරු වර්ෂයේ සිට බදු වාර්තා විද්‍යුත් මාර්ගයෙන් (ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන්) ගොනු කිරීම සෑම තනිපුද්ගල බදුගෙවන්නෙකුටම අනිවාර්ය වේ.

මීට අමතරව, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සිය මනාපය අනුව 2025 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තමන්ගේ ආදායම් බදු වාර්තාව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනිකව හෝ ඉදිරිපත් කළ හැකි ය.

ඉලෙක්ට්‍රොනිකව ආදායම් වාර්තාව ඉදිරිපත් කරන බදු ගෙවන්නන් හට වාර්තා ගොනු කිරීමට විකල්ප දෙකක් සලසා දී ඇත. ඒවා නම් සම්මත වාර්තාව සහ සරල කරන ලද ආදායම් වාර්තාවයි.

ඉලෙක්ට්‍රොනිකව ආදායම් වාර්තාව ඉදිරිපත් කරන බදු ගෙවන්නන් අතරින් සේවා නියුක්ති ආදායම සහ පොළී ආදායම පමණක් ඇති බදු ගෙවන්නන් සම්මත වාර්තාව වෙනුවට සරල කරන ලද ආදායම් වාර්තාව භාවිත කිරීමට සුදුසුකම් ලබයි.

ආදායම් වාර්තාව ලිඛිතව භාර දීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය ලබා ගෙන ඇති බදු ගෙවන්නන්ට සිය ආදායම් වාර්තාව ලිඛිතව ගොනු කළ හැකි ය.

අදාළ ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පහසුකම් සලසා තිබේ. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර www.ird.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

2. ආදායම් වාර්තාව, උපලේඛන සහ වත්කම් හා බැරකම් ප්‍රකාශය සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් මෙම උපදෙස් මාලාව කියවන්න.

3. **වාසික පුද්ගලයින් සහ නිර්වාසික පුද්ගලයින් 2025.04.01** සිට **2026.03.31** දක්වා වූ කාලසීමාව සඳහා සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් සහ වෙනත් මූලාශ්‍රයකින් උපයාගත් පිළිබඳව 2025/2026 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් වාර්තාවේ ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ.

4. **වාසික පුද්ගලයෙකුගේ** තක්සේරු කළ හැකි ආදායම, **මූලාශ්‍රය කවර ස්ථානයකින් උද්ගත වුව ද**, එම වර්ෂය සඳහා සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් හෝ වෙනත් ආදායම් මූලාශ්‍රයකින් එම පුද්ගලයාට ලැබෙන ආදායමට සමාන විය යුතු අතර **නිර්වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන්** වන විට එම වර්ෂය සඳහා **ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයකින් උද්ගත වන තාක් දුරට** සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් හෝ වෙනත් ආදායම් මූලාශ්‍රයකින් එම පුද්ගලයාට ලැබෙන ආදායමට සමාන විය යුතුය.

5. ආදායම් වාර්තාව ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ දී බදු ගෙවන්නාගේ කැමැත්ත පරිදි තෝරා ගනු ලබන භාෂාවකින් ඉදිරිපත් කළ හැකි ය. බදු වාර්තාව ලිඛිතව ඉදිරිපත් කරන බදු ගෙවන්නන්ට ආදායම් වාර්තාව තමන් කැමති භාෂාවකින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් බාගත කළ හැකි ය.

6. **ආදායම් බදු වාර්තාවේ හෝ යම් උපලේඛනයක කොටුවල දත්ත පිරවීම අවශ්‍ය නොවන** අවස්ථාවල දී, එම අදාළ කොටුවේ "අදාළ නොවේ" යනුවෙන් සඳහන් කිරීමට හෝ "කෙටි ඉරක්" යෙදීමට අවශ්‍ය නැත.

   උපලේඛනය හෝ උපලේඛනයක කොටසක් ඔබට අවශ්‍ය / අදාළ නොවේ නම්, "අදාළ නොවේ" යනුවෙන් උපලේඛනය හෝ උපලේඛනයේ කොටස හරහා සඳහන් කරන්න. **/** මුද්‍රණය කරන්න / ලියන්න.

   විස්තර ඇතුළත් කිරීමට **උපලේඛනයක** සපයා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන විට, වැඩිපුර පේළි එකතු කරන්න; ලිඛිතව ඉදිරිපත් කරන්නන් එම උපලේඛනයේ "**ඇමුණුම බලන්න**" යනුවෙන් සටහනක් ලියා අදාළ තොරතුරු වෙනම ඇමුණුමක දී ඇති ආකෘතියට සමාන අකෘතියක් මගින් සපයන්න.

නිවැරදි ලෙස දත්ත ඇතුළත් කිරීම පැහැදිලි කෙරෙන උදාහරණය

(බදු ගෙවන්නනාට ව්‍යාපාර ආදායම පමණක් ඇති අවස්ථාවකදී)

01 වන කොටස: බදු ආගණන ප්‍රකාශය
අ කොටස – බද්දට යටත් වන ආදායම

සේවානියුක්ති ආදායම	(උපලේඛන 1)	**10**												
ව්‍යාපාර ආදායම	(උපලේඛන 2)	**20**			**2**	**6**	**5**	**8**	**5**	**0**	**0**	**0**	**0**	**0**
ආයෝජන අදායම	(උපලේඛන 3)	**30**												
වෙනත් ආදායම්	(උපලේඛන 4)	**40**												
තක්සේරු කළ හැකි ආදායම (10+20+30+40)		**50**			**2**	**6**	**5**	**8**	**5**	**0**	**0**	**0**	**0**	**0**

7. සෑම පුද්ගලයෙකුට ම සියළුම අනිවාර්ය උපලේඛන සහ අදාළ අනෙකුත් ලිපිලේඛන සමඟ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආදායම් වාර්තාවක් **2026 නොවැම්බර් 30** වන දින හෝ එදිනට පෙර භාර දෙන ලෙස නියම කරනු ලැබේ.

8. බදු ගෙවීම

වාරික ගෙවන්නන් වශයෙන් ආදායම් බද්ද ගෙවීමට යටත් පුද්ගලයින්ට අදාළ තක්සේරු වර්ෂය සඳහා වන සිය බදු බැඳියාව ත්‍රෛමාසික වාරික වශයෙන් ගෙවිය යුතු අතර, ගෙවීමට තවදුරටත් ඉතිරිව තිබේ නම්, අවසාන ගෙවීම මගින් ගෙවීමට හැකියාව ඇත.

2025/2026 තක්සේරු වර්ෂය සඳහා ත්‍රෛමාසික වාරික ගෙවීමට නියමිත දිනයන් සහ ගෙවීම් කේන්ත පහත වගුවේ විස්තර කර ඇත.

වාරිකය	නියමිත දිනය (එදින හෝ ඊට	ගෙවීම්
1	2025 අගෝස්තු 15	25261
2	2025 නොවැම්බර් 15	25262
3	2026 පෙබරවාරි 15	25263
4	2026 මැයි 15	25264
අවසාන	2026 සැප්තැම්බර් 30	25260

වාරික ගෙවීම් හතර, අවසාන ගෙවීම සහ අදාළ වන බදු බැර වල සමුච්චිත අගය, 2025/2026 තක්සේරු වර්ෂයේ මුළු බදු බැඳියාවට සමාන විය යුතුය. දේශීය ආදායම් පනත යටතේ දණ්ඩන සහ පොළිය පැනවීම වළක්වා ගනු පිණිස ගෙවිය යුතු යම් ශේෂ බදු මුදලක් අවසාන ගෙවීම සඳහා නියමිත දින හෝ එදිනට පෙර ගෙවන ලෙස බදු ගෙවන්නන්ට උපදෙස් දෙනු ලැබේ.

9. දණ්ඩන, පොලිය සහ බන්ධනාගාරගත කිරීම

සාවද්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ නියමිත දිනට හෝ ඊට පෙර වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හෝ වාර්තාවක් භාර නොදීම **දණ්ඩනයන්ට හෝ බන්ධනාගාරගත කිරීමට** යටත් වේ.

නියමිත දිනට බදු ගෙවීමට අසමත් වීම, පහත පරිදි දණ්ඩනයන්ට සහ පොලී ගෙවීම් වලට යටත් වනු ඇත:

- **ප්‍රමාද වී වාර්තාවක් ගොනු කිරීම මත –**
  - (i) ගෙවීමට ඇති බදු මුදලින් 5% ක් සහ ගොනු කිරීමට අපොහොසත් වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණයෙන් 1% ක් ද: සහ

  - (ii) රු. 50,000 ක් සහ 2025 නොවැම්බර් 30 වන දිනෙන් පසු එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා වැඩිවුර රුපියල් 10,000 ද

  යන්නෙන්, වඩා **වැඩි මුදලට** සමාන දඩයකට යටත් වේ.

- **අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශයක්** සැපයීම සඳහා වන දණ්ඩනය, එකී ප්‍රකාශය පදනම් කරගෙන නිශ්චය කළේ නම් ගෙවිය යුතු බද්ද අඩුවන ප්‍රමාණය හෝ ආපසු ගෙවිය යුතු මුදල වැඩිවන ප්‍රමාණය, හෝ රු.50,000 යන මුදල් ප්‍රමාණවලින් **වැඩි අගය** වේ.

- **වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත්** වන තැනැත්තකු රුපියල් මිලියනයක් නොඉක්මවනු ලබන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවනු ලබන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඩුවම් දෙකටම හෝ යටත් වේ.

- ඉහත කී දේශීය ආදායම් පනතේ **126** වගන්තිය ප්‍රකාරව, බදු ගෙවන්නෙකු ආදායම් වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත් වුවහොත් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නිවේදනයට දින 30ක් ඇතුළත ප්‍රතිචාර නොදක්වන්නේ නම්, දේශීය ආදායම් පනතේ 185අ යටතේ නීතිමය පියවර ගනු ලැබේ.

- යම් කාලපරිච්ඡේදයක් ස**දහා ගෙවිය යුතු බදු මුදල** හෝ ඉන් කොටසක්

  - නියමිත දිනය වන විට **වාරික ගෙවීමක්** ලෙස ගෙවීමට අපොහොසත් වන යම් තැනැත්තකු, ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති බදු මුදලින් 10% කට සමාන දණ්ඩනයකට; සහ

  - ගෙවීමට නියමිත දිනය වන විට හෝ තක්සේරු දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනය වන විට ගෙවීමට අපොහොසත් වන තැනැත්තකු,

ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති බදු මුදල් ප්‍රමාණයෙන් 20% ක දණ්ඩනයකට; සහ

- නියමිත දිනයේ සිට බදු ගෙවන දිනය දක්වා වූ ප්‍රමාද කාලපරිච්ඡේදයේ මාසයක් හෝ මාසයකින් කොටසක් සඳහා1.5% ක පොලියකට යටත් වේ.

10. **නිශ්චිතව දක්වන ලද ආකෘතිය** - ඉහත කී දේශීය ආදායම් පනතේ 126 වගන්තිය ප්‍රකාරව, වාර්තාව සඳහා ආකෘතිය කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන අතර 2025/2026 තක්සේරු වර්ෂය (2025 අප්‍රේල් 01 සිට 2026 මාර්තු 31 දක්වා කාලසීමාව) සඳහා ආදායම සහ අනෙකුත් තොරතුරු ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ.

ආ. වාර්තා ආකෘතිය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

I. ආදායම් වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

- මෙම කොටස, කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - බදු ආගණන ප්‍රකාශය
2 කොටස - ප්‍රකාශය

1 කොටස - බදු ආගණන ප්‍රකාශය

- මෙම කොටස, කොටස් පහකින් සමන්විත වේ;

අ කොටස - බද්දට යටත් ආදායම
ආ කොටස - තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම්
ඇ කොටස - ගෙවිය යුතු බද්ද ගණනය කිරීම
ඈ කොටස - නිදහස් ආදායම / ඉවත් කළ ආදායම
ඉ කොටස - අනිවාර්ය උපලේඛන

ආදායම් වාර්තාවේ 1 වන කොටස සම්පූර්ණ කිරීමට පෙර අදාළ උපලේඛන සම්පූර්ණ කළ යුතුය.

ඒ අනුව, **ආදායම් වාර්තාව - උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්** අනුගමනය කර ඉන්පසුව පහත දක්වා ඇති පරිදි ආදායම් වාර්තාවේ ඉතිරි කොටස් සම්පූර්ණ කරන්න.

ආදායම් වාර්තාවේ කොටස		අදාළ කොටුව
අ කොටස තක්සේරු කළ හැකි ආදායම	-	50 කොටුව
ආ කොටස මුළු සහන තක්සේරු කළ හැකි ආදායමෙන් මුළු අඩු කිරීම් බදු අය කළ හැකි ආදායම	- - -	90 කොටුව 110 කොටුව 120 කොටුව
ඇ කොටස ගෙවිය යුතු මුළු බද්ද ගෙවිය යුතු ඉතිරි බද්ද ඉල්ලා සිටින ආපසු ගෙවීම	- - -	170 කොටුව 190 කොටුව 200 කොටුව
ඈ කොටස මුළු නිදහස් ආදායම **/** ඉවත් කළ ආදායම ප්‍රේෂණය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය	- -	210 කොටුව 210අ කොටුව
ඉ කොටස අනිවාර්ය උපලේඛන		

2 වන කොටස – ප්‍රකාශය

- ආදායම් වාර්තාව හෝ ආදායම් වාර්තාවේ කොටසක් අනුමත ගණකාධිකාරීවරයෙකු ඇතුළු වෙනත් යම් තැනැත්තකු විසින් ගෙවීමක් සඳහා සකස් කර ඇත්නම් "ඔව්" ලෙසත් එසේ නොවේ නම් "නැත" ලෙසත් සඳහන් කරන්න. ඔබ විසින් "ඔව්" ලෙස සඳහන් කළේ නම්, **ප්‍රකාශයේ අ-කොටස** සම්පූර්ණ කර අනුමත ගණකාධිකාරීවරයා හෝ වෙනත් යම් තැනැත්තා විසින් නිකුත් කරන ලද සහතිකය/සහතික අමුණන්න. එක් තැනැත්තෙකුට වඩා සම්බන්ධ වූ අවස්ථාවකදී, ඉහත තොරතුරු වෙනම පත්‍රිකාවක සම්පූර්ණ කර වාර්තාව සමඟ අමුණන්න.

- ලිඛිතව වාර්තා ගොනු කරන්නන් (2025.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ලිඛිතව වාර්තා ගොනු කිරීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ලබා ගත් අය)

- දේශීය ආදායම් පනතේ 126 (4) වගන්තිය ප්‍රකාරව, බදු ගෙවන්නා හෝ බදු ගෙවන්නාගේ නිසි බලයලත් නියෝජිතයා ආදායම් වාර්තාව, එහි නිරවද්‍යභාවය හා සම්පූර්ණත්වය තහවුරු කරමින් අත්සන් කළ යුතුය.

එබැවින්, බදු ගෙවන්නා හෝ ඔහුගේ නිසි බලයලත් අනුයෝජිතයා **ප්‍රකාශයේ අා කොටසෙහි** ඔහුගේ /ඇයගේ නම සඳහන් කරමින් අත්සන් කිරීම අවශ්‍ය වේ.

- වාර්තාව ඉලෙක්ට්‍රොනිකව පුරවන බදු ගෙවන්නන්, එහි ඉල්ලා ඇති විස්තර සපයමින් එම ප්‍රකාශනයේ අවසානයේ දක්වා ඇති කොටස නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය.

- ඔබ ආදායම් වාර්තාව ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කරන විට, උපලේඛනවල දක්වා ඇති කොටුවලට අදාල අගයන් නිවැරදිව ඇතුළත් කරන්නේ නම්, වාර්තාවේ දැක්වෙන කොටුවලට අදාල අගයන් තමන් විසින් ගණනය කර පිරවීමට අවශ්‍ය නොවේ. එම කොටුවල සඳහනන් විය යුතු අගයන් නිවැරදිව ගණනය වී ස්වයංක්‍රීයව එම කොටුවල පිර වේ.

II. ආදායම් වාර්තාව - උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. ආදායම් වාර්තාව සහ පහත සඳහන් උපලේඛන විද්‍යුත් මාර්ගයෙන් ගොනු කරන පුද්ගලයින් සඳහා ඉලෙක්ට්‍රොනිකව පිරිනමන අතර ලිඛිතව ගොනුකරන්නන්ට දෙපාර්තමේන්තු වෙබ් අඩවියට - **www.ird.gov.lk** පිවිස බාගත කළ හැකිය.

   1වන උපලේඛනය - සේවානියුක්ති ආදායම
   2 වන උපලේඛනය - ව්‍යාපාර ආදායම
   3 වන උපලේඛනය - ආයෝජන ආදායම
   4 වන උපලේඛනය - වෙනත් ආදායම් සහ ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරන ලද විදේශ මුදල් ප්‍රමාණය
   5 වන උපලේඛනය - සුදුසුකම් ලබන ගෙවීම් සහ වියදම් සහනය
   6 වන උපලේඛනය - අවසාන රදවා ගැනීමේ ගෙවීම් මත රදවා ගැනීමේ බද්ද
   7 වන උපලේඛනය - අත්තිකාරම් ආදායම් බද්ද/ රදවා ගැනීමේ බද්ද
   8 වන උපලේඛනය - බදු ආගණනය
   9 වන උපලේඛනය - බදු බැර
   10 වන උපලේඛනය - අලාභ ගැළපුම්

ඉහත සඳහන් උපලේඛන වලින් ඔබට අදාළ උපලේඛන පමණක් තෝරා ගෙන සම්පූර්ණ කරන්න.

වාර්තාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන උපලේඛන **අනිවාර්ය උපලේඛන** ලෙස සැළකේ. උපලේඛන අනිවාර්ය ලෙස සැළකිය යුතු අවස්ථාවන් කිහිපයක් පහත වගුවේ දැක්වේ.

පුද්ගලයාගේ ආදායම්		උපලේඛන									
		1	2	3	4	5	6	7	8	9	10
1	සේවා නියුක්ති ආදායම	√				√			√	√	
2	ව්‍යාපාර ආදායම පමණි		√						√	√	
3	ව්‍යාපාර ආදායම සහ අවසාන රඳවා ගැනීමේ ගෙවීම් සහිත ආයෝජන ආදායම		√	√			√		√	√	
4	අත්තිකාරම් ආදායම් බද්ද/ රඳවා ගැනීමේ බද්ද සමඟ ආයෝජන ආදායම පමණි			√				√	√	√	
5	සුදුසුකම් ලැබීමේ ගෙවීම් සමඟ වෙනත් ආදායම් සහ වර්ෂය තුළ ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණට කළ විදේශ මුදල් ප්‍රමාණය				√	√			√	√	
6	සේවානියුක්ති ආදායම, ව්‍යාපාර ආදායම, ආයෝජන ආදායම සහ අවසාන රඳවා ගැනීමේ බද්ද අත්තිකාරම් ආදායම් බද්ද/ රඳවා ගැනීමේ බද්ද සමඟ වෙනත් ආදායම්	√	√	√	√		√	√	√	√	
7	ඉදිරියට ගෙන ආ අලාභ/ තක්සේරු වර්ෂය තුළදී අලාභ සහිත ව්‍යාපාර ආදායම පමණි		√								√

ඉහත සලකුණු කළ උපලේඛනවලට අමතරව සුදුසුකම් ලබන ගෙවීම් , අවසාන රඳවා ගැනීමේ ගෙවීම් මත රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද/ රඳවා ගැනීමේ බද්ද ඉල්ලා සිටින/ ප්‍රකාශ කරන පුද්ගලයෙකු සම්බන්ධයෙන් පිළිවෙලින් **5 වන උපලේඛනය, 6 වන උපලේඛනය** සහ **7 වන උපලේඛනය** අනිවාර්ය වේ.

2. උපලේඛන පිරවීම සඳහා පහත පියවර අනුගමනය කරන්න.

පියවර 1 - ඔබගේ ආදායම් මූලාශ්‍රය සහ ඉල්ලා සිටින අඩු කිරීම් සඳහා අනිවාර්ය උපලේඛන තෝරා ගන්න.

පියවර 2 - සපයා ඇති උපදෙස් පරිදි අනිවාර්ය උපලේඛන සම්පූර්ණ කර එම උපලේඛන වල අගයන් ආදායම් වාර්තාවට ඇතුළත් කරන්න.

ඉලෙක්ට්‍රොනිකව වාර්තා ගොනු කරන්නන් විසින් උපලේඛනවලට ඇතුළත් කරන දත්ත ස්වයංක්‍රීයව ආදායම් වාර්තාවේ අදාළ ස්ථානවලට යොමු වේ.

සැ.යු. – 2025 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශීය මුදලින් බලපත්‍රලාභී බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන විදේශීය මූලාශ්‍ර ආදායම්, ආදායම් බද්දට යටත් වේ. එබැවින්, අදාළ පරිදි සේවා නියුක්ති, ව්‍යාපාර, ආයෝජන හෝ වෙනත් ආදායම් වැනි කාණ්ඩ යටතේ එවැනි විදේශ මූලාශ්‍ර ආදායම් ප්‍රකාශ කළ යුතුය.

ගෘහාශ්‍රිත සූර්ය පැනල වලින් ලැබෙන ආදායම ව්‍යාපාර ආදායම යටතේ වර්ග කළ යුතුය. දේශීය ආදායම් පනතේ 16 වන වගන්තියට අනුව ප්‍රාග්ධන දීමනා සඳහා හිමිකම් පෑම කළ හැකි ය.

දෙපාර්තමේන්තුව සතු කුලී, පොළී සහ සේවා නියුක්ති ආදායම් බදු ගෙවන්නන්ගේ ආදායම් වාර්තාවට දැනටමත් ඇතුළත් කර ඇත. කෙසේ නමුත්, බදු වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර එම තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට බදු ගෙවන්නාට අවස්ථාව සලසා ඇත.

1 වන උපලේඛනය - සේවානියුක්ති ආදායම

වාසික පුද්ගලයන්ට දේශීය මූලාශ්‍රවලින් සහ විදේශීය මූලාශ්‍රවලින් ලබන බදු අය කළ හැකි සියළුම සේවා නියුක්ති ආදායම් ද නිර්වාසික පුද්ගලයන්ගේ දේශීය මූලාශ්‍රවලින් ලැබෙන සේවා නියුක්ති ආදායම් **උපලේඛන 1හි** ප්‍රකාශ කළ යුතු ය.

මෙම උපලේඛනය සම්පූර්ණ කිරීමේදී, පහත සඳහන් ආදායම් **මුදල් පදනම** ප්‍රකාශ කළ යුතුය.

- සේවා නියුක්තියෙන් ලැබුණු පාරිශ්‍රමිකය (වැටුප්, වේතන, දීමනා, ප්‍රසාද දීමනා සහ සේවා නියුක්තියෙන් ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ)
- සේවාන්ත ප්‍රතිලාභ
- නිදහස් සේවා නියුක්ති ආදායම්
- බැහැර කරන ලද සේවා නියුක්ති ආදායම්

එක් එක් ආදායම් ප්‍රභේදය උපලේඛන **1**හි අදාළ කොටසෙහි ඇතුළත් කරන්න.

ප්‍රාථමික සේවානියුක්ති ආදායම සහ සේවාන්ත ප්‍රතිලාභ සඳහා ***A** ලෙසින් ද, ද්විතීයික සේවානියුක්ති ආදායම සහ සේවාන්ත ප්‍රතිලාභ සඳහා ***B** ලෙසින්ද වෙන වෙනම තීරු දක්වා ඇත.

(ද්විතීයික සේවා නියුක්ති එකකට වඩා වැඩි ගණනකින් ලැබෙන පරිශ්‍රමික හෝ සේවාන්ත ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන කල්හි, ඔබට 1 වන උපලේඛනයේ 101 හා 106 වන කොටුවල සපයා ඇති අතිරේක පේළි භාවිතා කල හැකිය. අදාළ බදු අනුපාත ඇමුණුම 07 හි ඇතුළත් වේ.

1. **104 තීරුවේ එකතුව 105 කොටුවේ සහ 109 තීරුවේ එකතුව 110 කොටුවේ** ඇතුළත් කරන්න.

2. **1 වන උපලේඛනයේ 110 කොටුවේ අගය 8 වන උපලේඛනයේ 802.1 කොටුවේ** ඇතුළත් කරන්න.

3. ඉන්පසුව, **105 කොටුවේ සහ 110 කොටුවේ අගයන්ගේ** එකතුව මෙම උපලේඛනයේ **111 කොටුවේ** ඇතුළත් කරන්න**. 111 කොටුවේ අගය ආදායම් වාර්තාවේ 10 කොටුවේ - සේවානියුක්ති ආදායම** යටතේ ඇතුළත් කරන්න.

4. ***නිදහස් / ඉවත් කළ ප්‍රමාණ*** - සේවානියුක්ති ආදායමට ආදළ නිදහස් / ඉවත් කළ ප්‍රමාණ **1 වන උපලේඛනයේ II වන කොටසේ** ප්‍රකාශ කරන්න**.**

(නිදහස් / ඉවත් කළ ප්‍රමාණ වල ලැයිස්තුව මෙම උපදෙස් මාලාව අවසානයේ **ඇමුණුම 2** හි දක්වා ඇත).

අවසානයේ **115 කොටුවේ** සඳහන් නිදහස් සේවානියුක්ති ආදායමේ නිදහස් ප්‍රමාණවල වල එකතුව **ආදායම් වාර්තාවේ 210 කොටුවේ - මුළු නිදහස් / ඉවත් කළ ආදායම** යටතේ ඇතුළත් කරන්න.

[නිදහස් / ඉවත් කළ ව්‍යාපාර ආදායමක් (216 කොටුව) සහ/ හෝ නිදහස් / ඉවත් කළ ආයෝජන ආදායමක් (317 කොටුව) ඇත්නම්, එම අගයන්ද නිදහස් / ඉවත් කළ සේවානියුක්ති ආදායමට (115 කොටුව) එකතු කර මුළු අගය **ආදායම් වාර්තාවේ** 210 කොටුවේ - මුළු නිදහස් / ඉවත් කළ ආදායම යටතේ ඇතුළත් කරන්න].

2 වන උපලේඛනය - ව්‍යාපාර ආදායම

වාසික පුද්ගලයන්ට දේශීය මූලාශ්‍රවලින් සහ විදේශීය මූලාශ්‍රවලින් ලබන බදු අය කළ හැකි සියළුම ව්‍යාපාර ආදායම් ද නිර්වාසික පුද්ගලයන්ගේ දේශීය මූලාශ්‍රවලින් ලැබෙන ව්‍යාපාර ආදායම් **, උපලේඛන 2 - ව්‍යාපාර ආදායම යටතේ ප්‍රකාශ කළ යුතුය.**

මෙම උපලේඛනය සම්පූර්ණ කිරීමේදී, පහත සඳහන් දෑ ඇතුළුව එක් එක් ව්‍යාපාර ආදායම් ප්‍රභේදය වෙන වෙනම නිර්ණය කර ප්‍රකාශ කරන්න.:

- තනි හිමිකාරිත්වය සහිත ව්‍යාපාරකින් ලැබුණු ආදායම
- හවුල් ව්‍යාපාරයකින් ලැබුණු ඔබේ ව්‍යාපාර ආදායම් කොටස
- ඔබට භාරයක් මගින් ලැබුණු ව්‍යාපාර ආදායමේ අර්ථලාභියාගේ කොටස

ව්‍යාපාරික ආදායම ප්‍රකාශ කල යුත්තේ එම වර්ශය සඳහා වන ඕනෑම අනුමත ව්‍යාපාරික අලාභයක් අඩු කිරීමෙන් පසුවය.

1. ඉහත දැක්වූ ව්‍යාපාර ආදායම **2 වන උපලේඛනයේ 1 වන කොටසේ 201, 202, 205, 206, 207, 210, 211** සහ **212** තීරු යටතේ අදාළ පේළිවල ඇතුළත් කරන්න.

2. **204**, **209 සහ 214 කොටුවල** ඇති අගයන්හි සමුච්චිත අගය **215 කොටුවේ** ඇතුළත් කරන්න. **215 කොටුවේ** අගය **ආදායම් වාර්තාවේ 20 කොටුවේ - ව්‍යාපාර ආදායම** යටතේ ඇතුළත් කරන්න**.**

3. ***නිදහස් / ඉවත් කළ ප්‍රමාණ*** **-** ව්‍යාපාර ආදායමට අදාළ නිදහස් / ඉවත් කළ ප්‍රමාණ **2 වන උපලේඛනයේ II වන කොටසේ** ප්‍රකාශ කරන්න.

4. **වැඩි කළ ප්‍රාග්ධන දීමනා -** දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ වැඩි කළ ප්‍රාග්ධන දීමනා සඳහා හිමිකම්පෑම් ඉදිරිපත් කළ බදු ගෙවන්නන් ඉඩ ලබා දිය හැකි ප්‍රමාණය ආදායම් වාර්තාවේ 216අ කොටුවට ඇතුළත් කර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කළහොත් සත්‍යාපනය කිරීම සඳහා ඉදිරිපත් කිරීම පිණිස සනාථ කිරීමේ ලිපිලේඛන සුරැකිව තබා ගත යුතු ය.

(නිදහස් / ඉවත් කළ ප්‍රමාණ වල ලැයිස්තුව මෙම උපදෙස් මාලාව අවසානයේ **ඇමුණුම 2** හි දක්වා ඇත).

අවසානයේ **216 කොටුවේ** සඳහන් නිදහස් / ඉවත් කළ ව්‍යාපාර ආදායමේ එකතුව **ආදායම් වාර්තාවේ 210 කොටුවේ - මුළු නිදහස් / ඉවත් කළ ආදායම** යටතේ ඇතුළත් කරන්න.

[නිදහස් / ඉවත් කළ සේවානියුක්ති ආදායමක් (115 කොටුව) සහ/ හෝ නිදහස් / ඉවත් කළ ආයෝජන ආදායමක් (317 කොටුව) ඇත්නම්, එම අගයන්ද නිදහස් / ඉවත් කළ ව්‍යාපාර ආදායමට (216 කොටුව) එකතු කර මුළු අගය ආදායම් වාර්තාවේ 210 කොටුවේ - මුළු නිදහස් / ඉවත් කළ ආදායම යටතේ ඇතුළත් කරන්න].

3 වන උපලේඛනය - ආයෝජන ආදායම

වාසික පුද්ගලයන්ට දේශීය මූලාශ්‍රවලින් සහ විදේශීය මූලාශ්‍රවලින් ලබන බදු අය කළ හැකි සියළුම ආයෝජන ආදායම් ද නිර්වාසික පුද්ගලයන්ගේ දේශීය මූලාශ්‍රවලින් ලැබෙන ආයෝජන ආදායම් **උපලේඛන 3 - ආයෝජන ආදායම** යටතේ ප්‍රකාශ කළ යුතුය.

මෙම උපලේඛනය සම්පූර්ණ කිරීමේදී, සියලුම ආයෝජන ආදායම් අදාළ ක්ෂේත්‍රයන්හි නිවැරදිව වාර්තා කර ඇති බවටත්, ඒවා බදු කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන ප්‍රමාණවත් වාර්තා මඟින් තහවුරු කර ඇති බවටත් වග බලා ගත යුතු ය.

ආයෝජන ආදායම ගණනය කිරීමේදී දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව යම් අඩු කිරීමක් සිදු කර ඇත්නම්, එම අඩු කිරීම් වලින් පසු ඉතිරි වන ආදායම් ප්‍රමාණය ප්‍රකාශ කළ යුතුය.

1. පහත සඳහන් එක් එක් ආයෝජන ආදායම් ප්‍රභේදවලින් ලද ආදායම වෙන වෙනම නිශ්චය කර වාර්තා කරන්න;

- පොලී ආදායම
- කුලී ආදායම
- ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලබන ලැබීම් - ප්‍රාග්ධන ලැබීම්
- ලාභාංශ
- වෙනත් ඕනෑම ආයෝජන ආදායමක්

2. ලාභාංශ ආදායම - වාසික තැනැත්තා

ඇ) 2023 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ලාභාංශ වලින් වන ලැබීම් සහ ලාභ සම්බන්ධයෙන්, එවැනි ලැබීම් සහ ලාභ සඳහා 15% ක අනුප්‍රමාණයකින් බදු අය කළ යුතුය. එම බදු ප්‍රමාණය උපලේඛන 06 යටතේ ප්‍රකාශ කළ යුතුය.

ආ) ලාභාංශ ආදායම - වාසික නොවන තැනැත්තා

2023 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක කාලසීමාව සඳහා ලාභාංශ වලින් වන ලැබීම් සහ ලාභ සම්බන්ධයෙන්, එවැනි ලැබීම් සහ ලාභ සඳහා 15% ක අනුප්‍රමාණයකින් බදු අය කළ යුතුය. එම ආදායම් ප්‍රමාණය විදේශ ව්‍යයහාර මුදලින් බලපත්‍රලාභී බැංකුවක් හරහා ප්‍රේෂණය කලේ නම්, එය විදේශ මූලාශ්‍ර ගත ආදායමක් ලෙස සැලකිය යුතුය.

3. **304**, **309 සහ 314 යන කොටුවල** සමුච්චිත අගය **315 කොටුවට** ඇතුළත් කරන්න. **315 කොටුවේ අගය ආදායම් වාර්තාවේ 30 කොටුවේ** ඇතුළත් කරන්න**.** මෙම ප්‍රමාණය **ආයෝජන ආදායමෙන් ලැබෙන ආදායම වේ.**

4. **සහන** -

- **කුලිය සඳහා සහනය -**

ආයෝජන වත්කමකින් කුලී ආදායමක් සහිත පුද්ගලයකු සම්බන්ධයෙන් වන කල්හි මුළු කුලී ආදායමෙන් සියයට 25 ක සහනයක් අඩු කළ හැකිය.

එම අගය **3 වන උපලේඛනයේ II වන කොටසේ 316** කොටුවේ ඇතුළත් කරන්න. ඉන්පසු එම අගය **ආදායම් වාර්තාවේ 60 වන කොටුවේ** ඇතුළත් කරන්න.

5. ආයෝජන ආදායමට අදාළ **නිදහස් ප්‍රමාණ 3 වන උපලේඛනයේ III වන කොටසේ** ඇතුළත් කරන්න**.**

(නිදහස් ප්‍රමාණ වල ලැයිස්තුව මෙම උපදෙස් මාලාව අවසානයේ **ඇමුණුම 2** හි දක්වා ඇත).

අවසානයේ 1 වන උපලේඛනයේ **115 කොටුවේ (නිදහස් / ඉවත් කළ සේවානියුක්ති ආදායම**), 2 වන උපලේඛනයේ **216 කොටුවේ (නිදහස් / ඉවත් කළ ව්‍යාපාර ආදායම)** සහ 3 වන උපලේඛනයේ **317 කොටුවේ (නිදහස් / ඉවත් කළ ආයෝජන ආදායම)** අගයන්හි එකතුව **ආදායම් වාර්තාවේ 210 කොටුවට - මුළු නිදහස් / ඉවත් කළ ආදායම** යටතේ ඇතුළත් කරන්න.

6. පොළී ආදායම/ ලභාංශ ආදායම/ කුලිය/ ලොතරැයි , ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදු ක්‍රීඩා වලින් දිනුම් ලැබීම් ජයග්‍රහණ ලෙස වන ආදායම/ වට්ටම් ආදායම/ වෙනත් ආයෝජන ආදායම් වට්ටම් අයකිරීම්/ රාජ්‍යභාග/ වාරික මුදලක් හෝ සමාන නිෂ්පාදන ස්වාභාවික සම්පත් ගෙවුමක් වැනි ඉහත සෑම ආදායම් මූලාශ්‍රයක්ම වෙන් වෙන්ව සත්‍ය පදනම මත සළකා බැලිය යුතු ය.

7. දේශීය ආදායම් පනතේ 52අ වගන්ති ප්‍රකාරව, ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ රක්ෂණ ඔප්පුහිමියා ලෙස හෝ අර්ථලාභියෙකු වශයෙන් යම් තැනැත්තෙකුට ලැබෙන යම් මුදල් ප්‍රමාණයක් රක්ෂිත තැනැත්තා මිය යාම, රක්ෂණ ඔප්පුව කල් පිරීම හෝ ඔප්පුව පවරන අගයක් අත්කර ගැනීම මත තක්සේරු කළ හැකි ආදායමෙන් බැහැර කළ හැකිය.

4 වන උපලේඛනය - වෙනත් ආදායම්

1. වෙනත් ආදායම් පිළිබඳ තොරතුරු **401 තීරුවේ** අදාළ පේළිවල ඇතුළත් කරන්න**.**

2. **403 කොටුවේ** අගය **ආදායම් වාර්තාවේ 40 කොටුවේ** ඇතුළත් කරන්න**.**

3. **406.** ඉ කොටුවේ අගය ආදායම් වාර්තාවේ 210 අ කොටුවේ ඇතුළත් කරන්න.

   සටහන - දේශීය ආදායම් පනතේ **8** වන වගන්තියේ කාර්යයන් සඳහා මෝටර් වාහන උපලබ්ධි වීමෙන් ලැබෙන ලැබීම්**,** වෙනත් ආදායම් ලෙස නොසැළකිය යුතු ය.

   මෝටර් වාහන උපලබ්ධි වීමෙන් ලැබෙන **,**ලැබීම්, වෙනත් ආදායම් ලෙස නොසැලකිය යුතු අතරම ගණුදෙනු මත ඇති වන අලාභ හෝ පාඩු අඩු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. මෙම මෝටර් වාහන ව්‍යාපාරයක වෙළඳ තොගය හෝ ක්ෂය කළ හැකි වත්කමක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක ඉහත කරුණු අදාළ නොවේ.

   එසේ ලැබෙන නිදහස් කළ ප්‍රමාණ සහ ඉවත් කළ ප්‍රමාණ 407 කොටුවට යොදන්න.

5 වන උපලේඛනය - සුදුසුකම් ලබන ගෙවීම් සහ වියදම් සහනය

- අදාළ වන සුදුසුකම් ලබන ගෙවීම් ඇතුළත් ලැයිස්තුව මෙම උපදෙස් මාලාව අවසානයේ **ඇමුණුම 3** හි දක්වා ඇත.

  - 5 **වන උපලේඛනය** ,අනු උපලේඛන පහකින් සමන්විත වේ.

- **5 අ උපලේඛනය** - තක්සේරු වර්ෂය තුළදී කරන ලද සුදුසුකම් ලබන ගෙවීම් (2017 අංක 24 දරන දේශීය ආදායම් පනත, 2021 අංක 10 දරන සංශෝධිත පනත සහ 2022 අංක 45 දරන සංශෝධිත පනත යටතේ)

- **5 ආ උපලේඛනය** - 2025/2026 තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ සුදුසුකම් ලබන ගෙවීම් (2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ **2018.04.01 දිනට පෙර කරන ලද සුදුසුකම් ලබන ගෙවීම් වලින්)**

- **5 ඇ උපලේඛනය -** වර්ෂය තුළ වාසික පුද්ගලයෙකු විසින් තම පරිශ්‍රයේ සුර්ය පැනල සවි කිරීමට දරන ලද වියදම සඳහා (2021 අංක 10 දරන සංශෝධිත දේශීය ආදායම් පනත ප්‍රකාරව එක් එක් වර්ෂය සඳහා උපරිමය රු. 600,000/- හෝ සත්‍ය වියදම යන ඒවායින් අඩු අගය)

- **5 ඈ උපලේඛනය** - සිනමා කර්මාන්තය සම්බන්ධයෙන් වන වියදම් සඳහා (2021 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව සිනමා ශාලාවක් ඉදි කිරීම සහ සූදානම් කිරීම හෝ වැඩිදියුණු කිරීම මත වන වියදම් යනාදිය ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සහතික කළ යුතුය.)

- **5 ඉ උපලේඛනය - ශ්‍රී ලංකා රජයට හෝ රජයේ අරමුදල් වෙත කරනු ලබන පරිත්‍යාග**

  2025.04.01 වන දින සිට තනි පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකා රජයට හෝ රජය විසින් පිහිටුවන ලද අරමුදලකට, මුදලින් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද සුදුසුකම් ලබන ගෙවීම් අදාළ තක්සේරු වර්ෂයේ සමස්ත තක්සේරු කළ හැකි ආදායමෙන් එය අඩු කළ පසුව ශේෂයක් වේ නම් එය ඊළඟ තක්සේරු වර්ෂයන්ට ඉදිරියට ගෙන යා හැකි ය.

➢ **සුදුසුකම් ලබන ගෙවීම්**

සුදුසුකම් ලබන ගෙවීම් ඇත්නම්, එම ගෙවීම් 5අ උපලේඛනයේ සහ 5ආ උපලේඛනයේ අදාළ පරිදි කොටුවල ඇතුළත් කරන්න.

5 වන උපලේඛනයේ 503 තීරුවේ සහ **507 තීරුවේ** සමුච්චිත අගයන් පිළිවෙලින් **504 කොටුවට** සහ **509 කොටුවට** ඇතුළත් කරන්න.

5ඈ උපලේඛනයේ 523 ඇති අගය **5අ උපලේඛනයේ 503.5 කොටුවට** ඇතුළත් කරන්න.

5ඉ උපලේඛනයේ අ+ආ අගය 5අ උපලේඛනයේ 503.2 කොටුවට ඇතුළත් කරන්න.

ඉන්පසු අඩු කළ හැකි මුළු සුදුසුකම් ලබන ගෙවීම් ප්‍රමාණය සඳහා **504 කොටුවේ** සහ **509 කොටුවේ** අගයන්හි එකතුව **510 කොටුවට** ඇතුළත් කරන්න.

510 කොටුවේ අගය **ආදායම් වාර්තාවේ 100 කොටුවට** ඇතුළත් කරන්න. මෙම අගය තක්සේරු වර්ෂය සඳහා අඩුකළ හැකි මුළු සුදුසුකම් ලබන ගෙවීම් වල ප්‍රමාණය වේ.

6 වන උපලේඛනය - අවසාන රදවා ගැනීමේ ගෙවීම් මත රදවා ගැනීමේ බද්ද

අවසාන රදවා ගැනීමේ ගෙවීම්, අවසාන නොවන රදවා ගැනීමේ ගෙවීම් සහ අදාළ වන බදු අනුප්‍රමාණ වගු **ඇමුණුම 4** හි දක්වා ඇත.

1. **6 වන උපලේඛනය** පහත පරිදි අනු උපලේඛන දෙකකින් සමන්විත වේ;
    - **06 අ උපලේඛනය -** අවසාන රදවාගැනීමේ ගෙවීම් - රදවාගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කළ රදවා ගැනීමේ බද්ද
    - **06 ආ උපලේඛනය -** අවසාන රදවාගැනීමේ ගෙවීම් - රදවාගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කර ගැනීමට අපොහොසත් වූ රදවාගැනීමේ බද්ද
2. **06 අ උපලේඛනය - අවසාන රදවා ගැනීමේ ගෙවීම් - රදවා ගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කළ රදවා ගැනීමේ බද්ද**

    රදවා ගැනීමේ අනුයෝජිතයා විසින් රදවා ගැනීමේ බදු අඩු කරන ලද සෑම අවසාන රදවා ගැනීමේ ගෙවීමකම තොරතුරු 601 සිට 606 තීරු යටතේ දී ඇති පේළිවල ඇතුළත් කරන්න. **අඩු කරන ලද අවසාන රදවා ගැනීමේ බදු වල එකතුව 607** කොටුවේ ඇතුළත් කරන්න.

3. **06 ආ උපලේඛනය - අවසාන රදවා ගැනීමේ ගෙවීම් - රදවා ගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කර ගැනිමට ගැනීමට අපොහොසත් වූ රදවා ගැනීමේ බද්ද**

    රදවා ගැනීමේ අනුයෝජිතයා විසින් **රදවා ගැනීමේ** බදු අඩු කිරීමට යටත් එහෙත් අනුයෝජිතයා විසින් බදු අඩු නොකළ රදවා ගැනීමේ ගෙවීම් වලට අදාළ තොරතුරු **06 ආ උපලේඛනයේ 608 සිට 613 දක්වා තීරුවල** දක්වා ඇති පේළිවල ඇතුළත් කරන්න. **612 තීරුවේ අගයන්හි එකතුව 614 කොටුවේ** ඇතුළත් කරන්න.

අවසානයේ **614 කොටුවේ** අගය **8 වන උපලේඛනයේ - බදු ආගණනය 811 කොටුවට** ඇතුළත් කරන්න.

7 වන උපලේඛනය - අත්තිකාරම් ආදායම් බද්ද /රඳවා ගැනීමේ බද්ද

1. මෙම උපලේඛනය පහත පරිදි අනු උපලේඛන තුනකින් සමන්විත වේ;

7අ උපලේඛනය - අනුයෝජිතයා විසින් අඩු කළ අත්තිකාරම් ආදායම් බද්ද/රඳවා ගැනීමේ බද්ද

7ආ උපලේඛනය - රඳවා ගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කිරීමට අපොහොසත් වූ රඳවා ගැනීමේ බද්ද

ඇ උපලේඛනය - හවුල් ව්‍යාපාරයේ අත්තිකාරම් ආදායම් බද්ද

2. අත්තිකාරම් ලැබීම් ඇතුළුව රඳවා ගැනීමේ බද්ද අඩු කරන ලද ගෙවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි ඇතුළත් කරන්න;

අත්තිකාරම් ආදායම් බද්ද/රඳවා ගැනීමේ බද්ද ගෙවීම	උපලේඛනය	අදාළ තීරුව/ කොටුව
අ. අත්තිකාරම් ආදායම් බද්ද/ රඳවා ගැනීමේ බද්ද - රඳවා ගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කරන ලද	7අ උපලේඛනය	701 සිට 706 දක්වා තීරු
ආ. රඳවා ගැනීමේ බද්ද - රඳවා ගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කිරීමට අපොහොසත් වූ	7ආ උපලේඛනය	712 සිට 717 දක්වා තීරු
ඇ. හවුල් ව්‍යාපාරයේ අත්තිකාරම් ආදායම් බද්ද	7ඇ උපලේඛනය	723, 724 කොටු

3. මූලාශ්‍ර සහ වර්ගවල ලැබීම් සඳහන් කිරීම සඳහා වෙන වෙනම පේළි භාවිතා කරන්න. **(**උදා. කුලිය, සේවා ගාස්තු, රාජ්‍ය භාග, වෙනත්**)** මූලාශ්‍රය සඳහන් කිරීමේදී**,**

- ලැබීම ව්‍යාපාර ආදායමක් නම් **B** ලෙස දක්වන්න**,**
- ලැබීම ආයෝජන ආදායමක් නම් **I** ලෙස දක්වන්න**.**

ලැබීම් වර්ගය දැක්වීමේදී ආදායම් වර්ගය කුලියක් නම් **R** ලෙස දක්වන්න**.**

ඒ අනුව, **701 තීරුවේ .1 සිට .5 දක්වා පේළිවල** වෙනස් ආදායම් මූලශ්‍ර සහ වර්ග පහත පරිදි දැක්වේ.

උදා**.** ව්‍යාපාරයෙන් ලද කුලී ආදායම **–** B-Rent
ආයෝජනයෙන් ලද කුලී ආදායම **–** I-Rent

4. 7අ උපලේඛනය - රඳවා ගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කළ අත්තිකාරම් ආදායම් බද්ද/ රඳවා ගැනීමේ බද්ද

i. එක් එක් අත්තිකාරම් ආදායම් බද්ද/ රඳවා ගැනීමේ බදු අඩු කිරීමක් (අත්තිකාරම් ගෙවීම මත අත්තිකාරම් ආදායම් බදු/ රඳවා ගැනීමේ බදු ඇතුළුව) සම්බන්ධයෙන් විස්තර **7 අ උපලේඛනයේ 701 සිට 706 දක්වා තීරුවල** ඇතුළත් කරන්න.

ii. **706** කොටුවේ එකතුව - රඳවා ගැනීමේ අනුයෝජිතයන් විසින් අඩු කරන ලද මුළු අත්තිකාරම් ආදායම් බදු/ රඳවා ගැනීම් බදු ප්‍රමාණය) **707** කොටුවට ඇතුළත් කරන්න. අත්තිකාරම් ලැබීම් මත 2024/2025 තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට රැගෙන එන ලද අත්තිකාරම් ආදායම් බදු/ රඳවා ගැනීම් බදු **708** කොටුවට ඇතුළත් කරන්න.

iii. **707 කොටුවේ** සහ **708 කොටුවේ** එකතුව **709 කොටුවට** ඇතුළත් කරන්න.

නොඑසේ නම්;

709 **කොටුවේ අගය 710 කොටුවට ඇතුළත් කර** 2025/2026 **තක්සේරු වර්ෂයේ මුළු අත්තිකාරම් ආදායම් බදු/ රඳවා ගැනීම් බදු ඉල්ලුම් කරන්න.** 710 **කොටුවේ අගය,** 9 **වන උපලේඛනයේ** 908 **කොටුවට ඇතුළත් කර මුළු බැර ඉල්ලුම් කරන්න. එවිට** 711 **කොටුවේ අගයක් නොමැති වේ ; හෝ**

නොඑසේ නම්;

අත්තිකාරම් ලැබීම් මත රඳවා ගැනීම් බදු අනාගත තක්සේරු වර්ෂයක දී අඩු කිරීම සඳහා ඉදිරියට ගෙන යන්න. වර්ෂය තුළ

අඩු කළ මුළු රදවා ගැනීමේ බදු ප්‍රමාණය 707 **කොටුවට ඇතුළත් කරන්න. අත්තිකාරම් ලැබීම් මත අඩු කර ඉදිරියට ගෙන එන ලද අත්තිකාරම් ආදායම් බදු/ රදවා ගැනීමේ බදු** 708 **කොටුවට ඇතුළත් කරන්න. 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඉල්ලුම් කරන අදාළ අත්තිකාරම් ආදායම් බදු/ රදවා ගැනීමේ බදු බැර (710 කොටුව) අගය, 709 කොටුවේ ඇති අගයෙන් අඩු කරන්න. බදු බැර ඉල්ලුම් කිරීම සඳහා 710 වන කොටුවේ ඇති අගය** 9 **වන උපලේඛනයේ** 908 **කොටුවට ඇතුළත් කරන්න.** 711 **කොටුවේ ඉතිරි වන ප්‍රමාණය අත්තිකාරම් ලැබීම් මත අදාළ ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන යන රදවා ගැනීම් බදු වනු ඇත**.

5. 7ආ උපලේඛනය - රදවා ගැනීමේ අනුයෝජිතයා විසින් අඩු කිරීමට අපොහොසත් වූ රදවා ගැනීමේ බද්ද

i. රදවා ගැනීමේ අනුයෝජිතයා විසින් රදවා ගැනීමේ බදු අඩු කිරීමට යටත් එහෙත් රදවා ගැනීමේ අනුයෝජිතයා විසින් බදු **අඩු නොකළ** රදවා ගැනීමේ ගෙවීම් වලට අදාළ තොරතුරු **7 ආ උපලේඛනයේ 712 සිට 717 තීරුවල** දක්වා ඇති පේළිවල ඇතුළත් කරන්න.

ii. 717 තීරුවේ එකතුව - රදවා ගැනීමට යටත් වන්නා විසින් ගෙවන ලද මුළු රදවා ගැනීමේ බද්ද 718 කොටුවේ ඇතුළත් කරන්න. අත්තිකාරම් ලැබීම් මත, 2024/2025 තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට රැගෙන එන ලද රදවා ගැනීමේ බද්ද 719 කොටුවට ඇතුළත් කරන්න.

iii. **718 කොටුවේ** සහ **719 කොටුවේ** අගයන්හි එකතුව **720 කොටුවට** ඇතුළත් කරන්න.

මුළු රදවා ගැනීමේ බද්ද, 202**5**/202**6 තක්සේරු වර්ෂය සඳහා ඉල්ලා සිටින්නේ නම්;**

- **720 කොටුවේ අගය 721 කොටුවට ඇතුළත් කරන්න. බදු බැර ලෙස ඉල්ලා සිටීම සඳහා 721 කොටුවේ අගය** 9**ආ උපලේඛනයේ 93**3 **කොටුවට ඇතුළත් කරන්න. එවිට** 7**22 කොටුවේ අගයක් නොමැති වේ. ; හෝ**

අත්තිකාරම් ලැබීම් මත රදවා ගැනීම් බදු ඉදිරි තක්සේරු වර්ෂයකදී අඩු කිරීම සඳහා ඉදිරියට ගෙන යන්නේ නම්;

- **තක්සේරු වර්ෂයේදී රදවා ගැනීමට යටත්වන්නා විසින් ගෙවන ලද මුළු රදවා ගැනීම් බදු ප්‍රමාණය** 7**18 කොටුවට ඇතුළත් කරන්න.** 202**4**/202**5 තක්සේරු**

වර්ෂයේ දී අත්තිකාරම් ලැබීම් මත රඳවා ගැනීමට යටත්වන්නා විසින් ගෙවන ලදුව ඉදිරියට ගෙන එන ලද රඳවා ගැනීම් බදු 719 කොටුවට ඇතුළත් කරන්න.

- 2025/2026 **තක්සේරු වර්ෂය සඳහා ඉල්ලා සිටින බදු බැර (721 කොටුව) 720 කොටුවේ අගයෙන් අඩු කරන්න. බදු බැර ඉල්ලා සිටීම සඳහා 721 කොටුවේ අගය 9 ආ වන උපලේඛනයේ 933 කොටුවට ඇතුළත් කරන්න. 722 කොටුවේ ඉතිරි වන ප්‍රමාණය, ඉදිරි වර්ෂය සඳහා අත්තිකාරම් ලැබීම් මත අඩු කිරීම සඳහා ඉදිරියට ගෙන යන රඳවා ගැනීම් බදු ප්‍රමාණයයි.**

6. 7ඇ උපලේඛනය – හවුල් ව්‍යාපාරයේ අත්තිකාරම් ආදායම් බද්ද

i. හවුල් ව්‍යාපාරයක් විසින් හවුල්කරුවන්ට බෙදා හරින ලද අත්තිකාරම් ආදායම් බදු මෙම උපලේඛනයේ ප්‍රකාශ කරන්න.

ii. ඒ අනුව, ඔබ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වන්නේ නම්, **හවුල් ව්‍යාපාර මගින් වෙන් කරන ලද අත්තිකාරම් ආදායම් බදු 723 කොටුවේ** ඇතුළත් කරන්න. 2024/2025 තක්සේරු වර්ෂයෙන් අත්තිකාරම් ලැබීම් මත ඉදිරියට ගෙන එන ලද අත්තිකාරම් ආදායම් බදු **724 කොටුවේ** ඇතුළත් කරන්න. **723 කොටුවේ** සහ **724 කොටුවේ** අගයන්හි එකතුව **725 කොටුවේ** ඇතුළත් කරන්න.

මුළු අත්තිකාරම් ආදායම් බදු 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඉල්ලා සිටින්නේ නම්;

- **725 කොටුවේ** අගය **726 කොටුවේ** ඇතුළත් කරන්න. බදු බැර ඉල්ලා සිටීම සඳහා **726 කොටුවේ අගය 9 වන උපලේඛනයේ 907 කොටුවේ** ඇතුළත් කරන්න. එවිට **727 කොටුවේ** අගයක් නොමැති වේ.; හෝ

අත්තිකාරම් ලැබීම් මත අත්තිකාරම් ආදායම් බදු ඉදිරි තක්සේරු වර්ෂ වලදී අඩු කිරීම සඳහා ඉදිරියට ගෙන යන්නේ නම්,

- **2025/2026 තක්සේරු වර්ෂයේදී ඉල්ලා සිටින** අත්තිකාරම් ආදායම් බදු ප්‍රමාණය (726 කොටුව) **725 කොටුවේ** අගයෙන් අඩු කරන්න. බදු බැර ඉල්ලා සිටීම සඳහා **726 කොටුවේ අගය 9 වන උපලේඛනයේ 907 කොටුවේ** ඇතුළත් කරන්න. **727 කොටුවේ** ඉතිරි වන ප්‍රමාණය අත්තිකාරම් ලැබීම් මත ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන යන අත්තිකාරම් ආදායම් බද්ද වේ.

8 වන උපලේඛනය - බදු ගණනය

1. මෙම උපලේඛනය **අ**, **අා**, **අෑ**, **අෑ**, **ඉ** සහ **ඊ** ලෙස කොටස් හයකින් සමන්විත වේ.

අ) බදු අය කළ හැකි ආදායම

ආදායම් වාර්තාවේ 120 කොටුවේ අගය - බදු අයකල හැකි ආදායම
මෙම උපලේඛනයේ **අ කොටසේ 801 කොටුවට** ඇතුළත් කරන්න.

අා) සේවාන්ත ප්‍රතිලාභ මත ආදායම් බදු ගණනය කිරීම

i. සේවාන්ත ප්‍රතිලාභ, සහනදායී අනුප්‍රමාණ හෝ සාමාන්‍ය වැඩිවන අනුප්‍රමාණ යටතේ බද්දට යටත්වේ.

- සහනදායී අනුප්‍රමාණ යටතේ බද්දට යටත් වන සේවාන්ත ප්‍රතිලාභ ලැයිස්තුව මෙම උපදෙස් මාලාව අවසානයේ **ඇමුණුම 5** හි දැක්වේ.
- සේවාන්ත ප්‍රතිලාභ මත අදාළ වන සහනදායී අනුප්‍රමාණ මෙම උපදෙස් මාලාව අවසානයේ **ඇමුණුම 6** හි දැක්වේ.
- වැඩිවන අනුප්‍රමාණ **ඇමුණුම 7** හි දැක්වේ

ii. **1 වන උපලේඛනයේ 1 කොටසේ 110 කොටුවේ** අගය මෙම උපලේඛනයේ **.1 තීරුවේ 802** පේළියේ ඇතුළත් කරන්න.

iii. සහනදායී අනුපාත යටතේ බද්දට යටත් වන සේවාන්ත ප්‍රතිලාභ, **.1 වන තීරුව - ආදායම** යටතේ අදාළ පේළිවල (**803.අ, 803.අා** සහ **803.අෑ** පේළි වල) සහ එම සේවාන්ත ප්‍රතිලාභය මත අදාළ වන බදු අනුප්‍රමාණය **.2 තීරුව - අනුප්‍රමාණය** යටතේ ඇතුළත් කරන්න.

වැඩිවන බදු අනුප්‍රමාණ යටතේ බද්දට යටත් වන සේවාන්ත ප්‍රතිලාභ .1 තීරුවේ 804 පේළියේ ඇතුළත් කරන්න.

ඉන්පසු මෙම උපදෙස් මාලාව අවසානයේ ඇති ඇමුණුම 6 හෝ 7 හි සඳහන් සහනදායී අනුප්‍රමාණ හෝ සාමාන්‍ය වැඩිවන බදු අනුප්‍රමාණ යෙදා ගනිමින් බද්ද ගණනය කරන්න.

803.**අ**, 803.**අා**, 803.**අෑ සහ 804 කොටුවල සඳහන් ආදායමට අදාළ බද්ද .3 තීරුවේ** 803.**අ.3**, 803.**අා.3**, 803.**අෑ.3 සහ 804.3 කොටුවල ඇතුළත් කරන්න.**

අවසානයේ 803.**අ.3**, 803.**ආ.3,** 803.**ඇ.3 සහ 804.3 කොටුවල සමුච්චිත අගය 805 කොටුවට ඇතුළත් කරන්න. 805 කොටුවේ අගය ආදායම් වාර්තාවේ 130 කොටුවට ගෙන යන්න**.

ඇ) ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් වන ලැබීම් මත බද්ද

i. ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් වන ලැබීම් (ආයෝජන වත්කම් විකිණීමෙන් ලැබෙන ප්‍රාග්ධන ලැබීම්) **10 %** ක අනුප්‍රමාණයට බද්දට යටත්වේ.

ii. හවුල් ව්‍යාපාරයකින් හැර ආයෝජන වත්කම් විකිණීමෙන් ලැබෙන ප්‍රාග්ධන ලැබීම්, **.1 වන තීරුවේ - ආදායම** යටතේ **806 පේළියේ** ඇතුළත් කරන්න.

iii. අදාළ බද්ද **.3 වන තීරුවේ 806 බද්ද යටතේ පේළියේ** ඇතුළත් කරන්න**.**

ඈ) හවුල් ව්‍යාපාර මඟින් ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් වන ලැබීම් මත බද්ද

i. හවුල් ව්‍යාපාරයක ආයෝජන වත්කම් විකිණීමෙන් වන ලැබීම් **10 %** ක අනුප්‍රමාණයට බද්දට යටත්වේ.

ii. හවුල් ව්‍යාපාරයක ආයෝජන වත්කම් විකිණීමෙන් ලැබෙන ප්‍රාග්ධන ලැබීම් **.1 වන තීරුවේ** - **ආදායම යටතේ 807 පේළියේ** සහ අදාළ බද්ද එම පේළියේ **.3 වන තීරුවේ - බද්ද** යටතේ ඇතුළත් කරන්න.

iii. **806.3 කොටුවේ** සහ **807.3 කොටුවේ** අගයන්හි එකතුව **ආදායම් වාර්තාවේ 140 කොටුවේ** ඇතුළත් කරන්න.

ඉ) ඉතිරි බදු අය කළ හැකි ආදායම මත බද්ද

- **ඔට්ටු හා සූදු, මත්පැන්, දුම්කොළ නිෂ්පාදනය කර හෝ ආනයනය කර විකිණීමේ ව්‍යාපාර මඟින් ලැබෙන බදු අය කළ හැකි ආදායම මත බද්ද**

- **2025.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි** අදාළ වන බදු අනුප්‍රමාණය **45%** කි**.**
- බදු අය කළ හැකි ආදායම **808.1 කොටුවේ** සහ එම ආදායම මත බද්ද **808.3 කොටුවේ** ඇතුළත් කරන්න.

- **වැඩිවන ආදායම් බදු අනුප්‍රමාණ යටතේ ඉහිරි බදු අය කළ හැකි ආදායම මත බද්ද**

  - **වැඩිවන ආදායම් බදු අනුප්‍රමාණ** යටතේ බද්දට යටත් වන.

  - ආදායම **809අ.1 කොටුවේ** ඇතුළත් කරන්න.

1. මෙම උපදෙස් මාලාව අවසානයේ සපයා ඇති **ඇමුණුම 7** හි සඳහන් වැඩිවන බදු අනුප්‍රමාණ පිළිබඳ විස්තර ඇත.

  - එම බද්ද **809අ.3 කොටුවේ** ඇතුළත් කරන්න.

- **විදේශ මූලාශ්‍රවලින් ලැබෙන ආදායම මත බද්ද**

  - යම් පුද්ගලයෙකුට විදේශ මූලාශ්‍රයකින් ලැබුණු ආදායම විදේශ ව්‍යවහාර මුදලින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද්දේ නම්, එම ආදායම සහනදායී බදු සැලකීමක් සඳහා සුදුසුකම් ලබයි.

2. බද්ද ගණනය කිරීම සඳහා:

  - විදේශීය මූලාශ්‍රයන්ගෙන් ලැබුණු අදාළ බදු අය කළ හැකි ආදායම 809 ආ.1 කොටුවෙහි ඇතුළත් කරන්න.

  - ඇමුණුම 7හි දක්වා ඇති අනුක්‍රමික ආදායම් බදු අනුප්‍රමාණ අදාළ කරන්න.

  - එවැනි ආදායම් සඳහා අදාළ වන බදු අනුපාතය15% ක උපරිම ප්‍රමාණයකට යටත් වේ

- **වෙනත් යම් බදු අය කළ හැකි ආදායමක් 809 ඇ.1 කොටුවට ද, අනුප්‍රමාණ 809 ඇ.2 කොටුවට ද බද්ද 809 ඇ.3, කොටුවට ද ඇතුළත් කරන්න.**

  - **80.3, 809 අ.3,809 ආ.3 සහ 809 ඇ.3 කොටුවල** සමුච්චිත අගය **810 කොටුවට** ඇතුළත් කරන්න.

අවසානයේ **810 කොටුවේ** අගය **ආදායම් වාර්තාවේ 150 කොටුවට** ඇතුළත් කරන්න.

(ඊ) අවසාන රදවා ගැනීමේ ගෙවීම් මත බද්ද

  - 6 වන උපලේඛනයේ 614 කොටුවේ සම්මුචිත අගය 811 කොටුවට ඇතුළත් කරන්න.

  - අවසානයේ 811 කොටුවේ අගය ආදායම් වාර්තාවේ 160 කොටුවට ගෙන යන්න.

9 වන උපලේඛනය - බදු බැර

ඉල්ලුම් කරන බදු බැර **9 වන උපලේඛනයේ** අදාළ කොටුවල ඇතුළත් කරන්න.

(අ) විදේශ බදු බැර (901 කොටුව)

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 80 වන සහ 81 වන වගන්ති යටතේ යම් විදේශ බදු බැරක් සඳහා ඔබට හිමිකම ඇත්තේ නම්, එවැනි ඉඩදිය හැකි ප්‍රමාණ **9 වන උපලේඛනයේ 901 කොටුවට** ඇතුළත් කරන්න.

- ශ්‍රී ලංකාවේ දී බදු අය කළ හැකි ආදායමට යටත් වන ආදායම මත ගෙවිය යුතු බද්දට ගෙවූ විදේශ ආදායම් බදු බැර ලෙස ගැලපිය හැක.
- හිමිකම් පාන ලද බැර ප්‍රමාණය, එම විදේශ ආදායමට ආරෝපණය කළ හැකි ශ්‍රී ලංකාවේ ආදායම් බදු ප්‍රමාණය ඉක්මවා යා නොහැකි ය.
- ගෙවන ලද යම් අතිරේක විදේශ බදු මුදලක්, පනත මගින් විශේෂිතව ඉඩ ලබා දී නොමැති නම් හැර, ආපසු ගෙවීම හෝ ඉදිරියට ගෙන යාම සිදු කළ නොහැකි ය.
- ආදායමට හෝ ප්‍රතිලාභවලට ආරෝපණය කළ හැකි බදු පමණක් බැර සඳහා සුදුසුකම් ලබයි; VAT හෝ සමාන අය බදු වැනි වක්‍ර බදු බැර සඳහා සුදුසුකම් නොලබයි.

බදු ගෙවන්නන් හිමිකම්පෑම තහවුරු කිරීම සඳහා විදේශ බදු සහනික හෝ තක්සේරු කිරීම් වැනි සනාථ කිරීමේ ලිපිලේඛන සුරැකිව තබා ගත යුතු ය.

(ආ) 60% ස්වයං තක්සේරු බදු ආපසු ඉල්ලීම (902අ කොටුව)

2023.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු ගෙවන්නා විසින් ගෙවිය යුතු පසු ආදායම් බද්දට එදිරිව බදු ගෙවන්නන් 60% ක ආපසු ගෙවනු ලැබිය හැකි මුදල් ප්‍රමාණය හිලව් කර ගත යුතුය. (බදු විගණනයට පෙරාතුව) එලෙස ආපසු ලබා ගැනීම සඳහා ඉල්ලන ප්‍රමාණය **902අ** වන කොටුවට ඇතුළත් කරන්න.

(ඇ) සේවා නියුක්ති ආදායම මත ගෙවූ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද - ප්‍රාථමික සේවා නියුක්තිය (903 කොටුව)

ප්‍රාථමික සේවා නියුක්තියකින් සේවා නියුක්ති ආදායමක් සහිත පුද්ගලයන්, ප්‍රාථමික සේවායෝජකයා විසින් අඩු කළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සඳහා බදු බැර ඉල්ලුම් කිරීමට හිමිකම් ලබයි.

ප්‍රාථමික සේවායෝජකයා විසින් පාරිශ්‍රමික මත අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බද්ද **903අ, 903ආ, 903ඇ කොටුවල** ඇතුළත් කරන්න. ඔබගේ ප්‍රාථමික සේවායෝජකයා විසින් නිකුත් කළ අ.පු.ආ.බ. / ටී.10 (නව) සහනිකය අමුණන්න.

(අෑ) සේවා නියුක්ති ආදායම මත ගෙවූ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද - ද්විතියික සේවා නියුක්තිය (904 කොටුව)

සේවා නියුක්තීන් එකකට වඩා ඇති පුද්ගලයින්ගේ ප්‍රාථමික සේවා නියුක්තිය හැර අනෙකුත් සේවා නියුක්තීන් ද්විතියික සේවා නියුක්ති ලෙස සැලකේ. සෑම ද්විතියික සේවායෝජකයකු විසින්ම පාරිශ්‍රමිකය මත අඩු කළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද වෙන වෙනම ඇතුළත් කරන්න. (කරුණාකර **අ.පු.ආ.බ. / ටී.10** (**නව)** සහතිකය අමුණන්න).

(ඉ) සේවාන්ත ප්‍රතිලාභ මත ගෙවූ බද්ද (905 කොටුව)

අඩු කළ සහ ගෙවූ බදු, බදු බැරක් ලෙස ඉල්ලා සිටිය හැකිය. එවැනි ප්‍රමාණ 905 කොටුවේ ඇතුළත් කරන්න**.**

ඊ) හවුල්කරුගේ හවුල් ව්‍යාපාර බද්දේ කොටස (906 කොටුව)

මෙම කොටුව පිරවීමට පෙර **9ආ උපලේඛනය** සම්පූර්ණ කරන්න.

- 2020.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි හවුල් ව්‍යාපාර, හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම මත ආදායම් බදු ගෙවීමට යටත් වේ.
- 2024/2025 තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද හවුල් ව්‍යාපාර බද්දේ ඉතිරි කොටස **922 කොටුවේ** ඇතුළත් කරන්න.
- 2025/2026 තක්සේරු වර්ෂයේදී හවුල්කරුට ගෙවන ලද හවුල් ව්‍යාපාර බද්දේ කොටස **923 කොටුවේ** ඇතුළත් කරන්න.
- හවුල් ව්‍යාපාර බද්දේ හවුල්කරුගේ මුළු කොටස **(922** සහ **923 කොටුවල** එකතුව) **924 කොටුවට** සහ 2025/2026 තක්සේරු වර්ෂයේදී අඩු කළ හැකි ප්‍රමාණය **925 කොටුවට** ඇතුළත් කරන්න.

උ) හවුල් ව්‍යාපාරය මගින් අත්තිකාරම් ආදායම් බද්ද (907 කොටුව)

7ඈ උපලේඛනයේ 726 කොටුවේ සඳහන් හවුල් ව්‍යාපාරයෙන් බෙදා වෙන් කළ ප්‍රමාණය **907 කොටුවට** ඇතුළත් කරන්න (භාර මගින් වෙන් කරන ලද ප්‍රමාණද ඇතුළත් කළ හැකිය).

ඌ) අත්තිකාරම් ආදායම් බදු බැර - රඳවා ගැනීමේ අනුයෝජිතයා විසින් අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරන ලද (908 කොටුව)

7අ උපලේඛනයේ 710 කොටුවේ ප්‍රමාණය**, 908 කොටුවට** ඇතුළත් කරන්න.

එ) ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් වන ලැබීම් මත ගෙවූ බද්ද (909 කොටුව)

ගෙවූ ප්‍රමාණයන් **909 කොටුවට** ඇතුළත් කරන්න.

ඒ) හවුල් ව්‍යාපාරයක් මගින් ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් වන ලැබීම් මත ගෙවූ බද්ද (910 කොටුව)

හවුල් ව්‍යාපාරය විසින් වෙන් කළ ප්‍රමාණ **910 කොටුවට** ඇතුළත් කරන්න.

ඔ) රඳවා ගනු ලැබීමට යටත්වන්නා විසින් ගෙවූ වාරික ගෙවීම් සහ අත්තිකාරම් ආදායම් බදු/ රඳවා ගැනීමේ බදු (911 කොටුව)

මෙම කොටුව පිරවීමට පෙර 9ආ උපලේඛනය පුරවන්න.

i. වාරික ගෙවීම් සහ අවසාන ගෙවීම, දී ඇති පේළිවල ඇතුළත් කරන්න.

ii. වාරික ගෙවීම් සහ අවසාන ගෙවීමේ එකතුව **932 කොටුවට** ඇතුළත් කරන්න.

iii. 6ආ උපලේඛනයේ **614 කොටුවේ** සහ 7ආ උපලේඛනයේ **721 කොටුවේ** සඳහන් පරිදි රඳවා ගනු ලැබීමට යටත් වන්නා විසින් සිදුකළ අත්තිකාරම් ආදායම් බදු/ රඳවා ගැනීමේ බදු ගෙවීම් ප්‍රමාණයන් **933 කොටුවට** ඇතුළත් කරන්න.

iv. 932 සහ 933 කොටුවල එකතුව 934 කොටුවට ඇතුළත් කරන්න.

v. 934 වන කොටුවේ ප්‍රමාණය, 9 වන උපලේඛනයේ 911 වන කොටුවට ඇතුළත් කරන්න.

ඕ) 901 සිට 911 දක්වා කොටුවල එකතුව **912 කොටුවට** ඇතුළත් කරන්න. අවසානයේ දී **912 කොටුවේ** ප්‍රමාණය **ආදායම් වාර්තාවේ 180 කොටුවට** ඇතුළත් කරන්න.

10 වන උපලේඛනය - අලාභ ගැළපුම්

i. තක්සේරු වර්ෂය තුළදී උද්ගත වූ හෝ ඉදිරියට ගෙන ආ අලාභ මෙම උපලේඛනයේ ඇතුළත් කරන්න.

ii. අලාභය ලාභයක් වූයේ නම්, 40% ක අනුප්‍රමාණයකින් සහ වැඩිවන අනුප්‍රමාණ යටතේ බදු අය කළ හැකි ව්‍යාපාර අලාභ ප්‍රකාශ කිරීමට 1අ සහ 1ආ කොටස සපයා ඇත.

iii. 2019/2020**,** 2020/2021**,** 2021/2022**,** 2022/2023**,** 2023/2024 සහ 2024/2025 තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ අලාභ එයට අදාළ පේළියේ සහ වර්ෂය තුළ අලාභ ඊළඟ පේළියේ 0.2 තීරුවේ ඇතුළත් කරන්න.

iv. අලාභ හිලව් කිරීමට අදහස් කරන පවත්නා තකසේරු වර්ෂයේ දී උපයන ලද ලාභ 0**.3 සිට 0.7 දක්වා තීරුවල** ඇතුළත් කරන්න.

v. තැනැත්තෙකු විසින් හිමිකාරිත්වය දරන වත්කමක් ව්‍යාපාරයකින් විවිධ වූ බදු අනුප්‍රමාණයනගෙන් බදු අය කළ හැකි විවිධිකාර ලැබීම් සහ ලාභ ඉපයීමට (අලාභ ඇතුළුව) යොදා ගන්නේ නම් වත්කමෙහි පිරිවැය සහ ලැබුණු ප්‍රතිෂ්ඨාව, අදාළ ලැබීම් සහ ලාභ ඉපයීමට යොදාගත් වත්කම් කොටස්වල වෙළඳපළ වටිනාකම අනුව එවැනි ලාභ සහ ලැබීම් අතර බෙදා වෙන කළ යුතුය.

ඇ. වත්කම් හා බැරකම් ප්‍රකාශය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

A* - ශ්‍රී ලංකාවේ ඇති සියලුම නිශ්චල දේපල දක්වන්න.
B* - ශ්‍රී ලංකාවෙන් පිටත ඇති සියලුම නිශ්චල දේපල දක්වන්න.
A*-1 – 2026.03.31 දිනට ඔබට අයත් නේවාසික ස්ථානය පිළිබඳ විස්තර

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 (2) වගන්තිය ප්‍රකාරව, වාර්තාව මගින් ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ වාර්තාව සමග ගොනු කළ යුතු ඇමුණුම් තිබේ නම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකිය.

ඒ අනුව, තක්සේරු වර්ෂයේ අවසාන දිනට එනම් 2026 මාර්තු 31 දිනට (ඔබගේ) සෑම වත්කමක සහ බැරකමක (ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පිහිටි) වටිනාකම, වාර්තාව සමග ඔබ වෙත ලබා දී ඇති **වත්කම් හා බැරකම් ප්‍රකාශයේ** සඳහන් කර වාර්තාව සමග භාර දෙන්න.

(කරුණාකර, අත්පත් කරගැනීමක් නම් අත්පත් කර ගැනීමේ පිරිවැය හෝ අත්පත් කර ගැනීමක් නොවේ නම් වෙළඳපල වටිනාකම ප්‍රකාශ කරන්න).

01 කොටස

අ. නිශ්චල දේපල

2026.03.31 දිනට ඔබගේ සියළු නිශ්චල දේපළ පිළිබඳව (ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පවතින) ප්‍රකාශ කරන්න.

ආ. චංචල දේපල

2026.03.31 දිනට ආ(i) හි මෝටර් රථ, ආ(ii) හි කාලීන තැන්පතු ඇතුළු බැංකු ශේෂ, ආ(iii) හි කොටස්/ස්කන්ධ /සුරැකුම්පත්, ආ(iv) හි අතේ ඇති මුදල්, ආ(v) හි ලබා දී ඇති ණය සහ ලැබිය යුතු මුදල් සහ ආ(vi) හි රන්, රිදී, මැණික්, ස්වර්ණාභරණ කාසි, සිතුවම්, පුරාවස්තු, මුද්දර, මූර්ති, වෙනත් එකතු කළ හැකි භාණ්ඩ සහ අතථ්‍ය වත්කම් වැනි සියලුම චංචල දේපළ (ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඇති) වටිනාකම් සමඟ ප්‍රකාශ කරන්න.

ඇ. ව්‍යාපාරයේ කොටසක් ලෙස තබාගෙන ඇති දේපළ

2026.03.31 දිනට ව්‍යාපාරයේ කොටසක් ලෙස ඇති දේපළක වටිනාකම, එනම් ප්‍රාග්ධන හෝ ජංගම ගිණුමක ශේෂය ප්‍රකාශ කළ යුතුය. (අදාළ වන්නේ නම් ශේෂ පත්‍රයේ පිටපත් අමුණන්න).

ඈ. 2026.03.31 දිනට බැරකම්

වසර තුළ දී පුද්ගලයෙකුට හෝ ආයතනයකට ගෙවිය යුතු ණය ඇතුළු සියළු බැරකම් මෙම කොටසේ ප්‍රකාශ කළ යුතුය.

02 කොටස

අ. වර්ෂය තුළ දී අත්පත් කරගත් වෙනත් යම් වත්කම් හෝ ලද ත්‍යාග

2026.03.31 දිනට ඔබ විසින් අත්පත් කරගත් හෝ ඔබට තෑගි ලෙස ලැබුණු රන්, රිදී, මැණික් හා ස්වර්ණාභරණ, කාසි, සිතුවම්, පුරාවස්තු, මුද්දර, මූර්ති, අනෙකුත් එකතු කළ හැකි භාණ්ඩ සහ අතථ්‍ය වත්කම්වල වටිනාකම් ප්‍රකාශ කරන්න.

අත්පත් කරගත් දේපළ සහ ලැබුණු ත්‍යාග ඇතුළු වත්කම්වල මුළු වටිනාකම ප්‍රකාශ කරන්න

ආ. වර්ෂය තුළ දී කොටස් ඇතුළු (විකිණීම/පැවරීම/ත්‍යාග) වත්කම් බැහැර කිරීම

2025.04.01 සිට 2026.03.31 දක්වා කාලසීමාව තුල බැහැර කළ වත්කම්වල මුළු වටිනාකම ප්‍රකාශ කරන්න (විකිණීම, හුවමාරු, ත්‍යාග).

ඇමුණුම්

ඇමුණුම 1 - අදාළ වන සහන

දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 2 වන ඡේදය යටතේ ලබා දී ඇති සහන

අ) **පුද්ගලික සහනය** - දේශීය ආදායම් පනතේ 5 වන උපලේඛනයේ 2 වන ඡේදයේ (අ) උපඡේදය යටතේ වන සහනය - තක්සේරු වර්ෂය සඳහා මුළු තක්සේරු කළ හැකි ආදායම දක්වා රු. 1,800,000 (ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබෙන යම් ලැබීමක් හැර).

ආ) **කුලී ආදායම සඳහා සහනය** - දේශීය ආදායම් පනතේ 5 වන උපලේඛනයේ 2 වන ඡේදයේ (ඈ) උපඡේදය යටතේ ලබා දී ඇති සහනය - තක්සේරු වර්ෂය සඳහා මුළු කුලී ආදායමෙන් 25% ක ප්‍රමාණයක්

ඇ) තම පරිශ්‍රයේ සවි කිරීම සඳහා සූර්ය පැනල අත්කරගෙන එය ජාතික විදුලි බල පද්ධතියට සම්බන්ධ කර ඇති වාසික පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, එම සූර්ය පැනල සඳහා වූ මුළු වියදම දක්වා හෝ එම සූර්ය පැනල අත්කර ගැනීම සඳහා ලබාගත් ණය මුදලක් සම්බන්ධයෙන් බැංකුවට ගෙවන ලද මුදල් ප්‍රමාණය තෙක් එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු.600,000 ක සහනයක් දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයෙහි 2 වන ඡේදයේ (උ) උපඡේදය යටතේ ප්‍රදානය වේ .

සටහන: ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වන පුද්ගලයෙකුගේ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී, දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට යටත්ව ඉහත සඳහන් සමුච්චිත සහන අඩු කළ හැකිය. කෙසේ වෙතත්, නිර්වාසිකයෙකු වන නමුත් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන පුද්ගලයෙකුට බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී ඉහත අ) ඡේදයේ සඳහන් පුද්ගල සහනය පමණක් අඩු කළ හැකිය.

ඇමුණුම 2 - නිදහස් ප්‍රමාණ (පුද්ගලයින් සඳහා අදාළ වන)

(1) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ වන නිදහස් කිරීම්

අ) i. තැනැත්තෙකු හට සිදු වූ පෞද්ගලික හානියක් සම්බන්ධයෙන් හෝ

ii. වෙනත් තැනැත්තෙකුගේ මරණයක් හෝ සම්බන්ධයෙන්

වන්දි හෝ පාරිතෝෂිකයක් ලෙස යම් තැනැත්තෙකුට ගෙවන ලද ප්‍රාග්ධන වියදම්

ආ) විශ්‍රාම ආදායම ශ්‍රී ලංකා රජය හෝ ශ්‍රී ලංකා රජයේ දෙපාර්තමේන්තුවක් මඟින් ගෙවනු ලබන අවස්ථාවක දී තැනැත්තෙකුගේ විශ්‍රාම වැටුප

ඇ) i. යම් විශ්‍රාම අරමුදලක් හෝ 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත මඟින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

මඟින් කරන ලද ආයෝජනවලින් උපයන ලද ආදායම් නියෝජනය වන ලෙසට 1987 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාල පරිච්ඡේදයක් සඳහා එම අරමුදලකින්; සහ

ii. කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද අර්ථසාධක අරමුදලකින් හෝ යම් නියාමනය කරන ලද අර්ථසාධක අරමුදලකින්;

සේවා නියුක්තිකයෙකුට විශ්‍රාම යන අවස්ථාවේ දී ගෙවනු ලබන යම් මුදල් ප්‍රමාණයක්

ඇ) i. තානාපති විනිර්මුක්ත නීතියක් හෝ සමාන නීතියක් මඟින්

ii. වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ආයතනයන්ගේ සම්මුතිය බලාත්මක කරනු ලබන පනතක් මඟින්; හෝ

iii. ජාත්‍යන්තර සංවිධානයකට අදාළව මේ පනත යටතේ සාදන ලද නියෝග හෝ ඉහත (i) වන හෝ (ii) වන උපඡේදවල සඳහන් කරන ලද නීතියක් හෝ පනතක් යටතේ සාදන ලද නියෝග මඟින්;

විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට වරප්‍රසාද හිමිවිය යුතු යම් පුද්ගලයෙකුගේ ආදායම

ඉ) ආයෝජන වත්කමක් කොටස් දෙකකින් හෝ ඊට වැඩියෙන් උපලබ්ධි කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අවස්ථාවකදී, සියළු කොටස් උපලබ්ධි වීමෙන් ලැබෙන මුළු ලැබීම් රු. 50,000 නොඉක්මවන්නේ නම් සහ තක්සේරු වර්ෂය තුළ ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම මඟින් වාසික පුද්ගලයා විසින් ලබා ගන්නා ලද මුළු ලැබීම් රු. 600,000 ක් නොඉක්මවන්නේ නම් එම උපලබ්ධි කිරීම මඟින් ඇතිවන යම් ලැබීමක් නිදහස් වේ

I. හවුලේ අයිති වන්නා වූ ආයෝජන වත්කමක් උපලබ්ධි කරන අවස්ථාවකදී වත්කම උපලබ්ධි කිරීම මත ආයෝජන වත්කමෙහි සියළු හිමිකරුවන් විසින් ලැබූ මුළු ලැබීම් රු. 50,000 නොඉක්මවන්නේ නම් සහ තක්සේරු වර්ෂය තුළ වාසික පුද්ගලයා විසින් ලබා ගන්නා ලද මුළු ලැබීම් රු. 600,000 ක් නොඉක්මවන්නේ නම් එම ලැබීම නිදහස් වේ.

II. ඉහත අවස්ථාවලදී හැර, තක්සේරු වර්ෂය තුළ ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම මඟින් වාසික පුද්ගලයා විසින් ලබා ගන්නා ලද මුළු ලැබීම් රු. 600,000 ක් නොඉක්මවන අවස්ථාවකදී සහ ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම මඟින් වාසික තැනැත්තා ලබා ගන්නා ලද රු. 50,000 නොඉක්මවන ලැබීමක්

ඊ) උපලබ්ධිවීමට පෙර වසර තුනක් අඛණ්ඩව මූලික වාසික ස්ථානය තනි පුද්ගලයාට හිමිව ඇත්නම් සහ එම වසර තුනෙන් අවම වශයෙන් වසර දෙකක් එහි තනි පුද්ගලයා ජීවත් වූයේ නම් (දෛනික පදනමකින් ගණනය කිරීමෙන්) එම තනි පුද්ගලයාගේ ප්‍රධාන වාසික ස්ථානය උපලබ්ධි වීම මගින් වාසික තනි පුද්ගලයාට හිමිවන ලැබීමක්

උ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍රලාභී යම් කොටස් වෙළඳපලක් මගින් පළ කරන ලද නිල ලැයිස්තුවක උපුටා ඇති කොටස් වලින් සමන්විත වූ වත්කමක් උපලබ්ධි වීමෙන් හිමිවන ලැබීමක් අදාල ගෙවීම් සිදුකර ගෙවා ඇති අවස්ථාවක

ඌ) යම් තැනැත්තෙකු විසින් කරන ලද නව නිර්මාණයක් හෝ යම් පර්යේෂණයක් ඇගයීමක් වශයෙන් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා විසින් හෝ රජය විසින් පිරිනමන ලද ප්‍රදානයක් වශයෙන් ලැබුණු ත්‍යාගයක්

එ) 1978 අංක 7 දරණ ජනාධිපති අරමුදල් පනත මඟින් ස්ථාපිත කරන ලද ජනාධිපති අරමුදලින් හෝ 1985 අංක 9 දරණ ජාතික ආරක්ෂක අරමුදල් පනත මඟින් ස්ථාපිත කරන ලද ජාතික ආරක්ෂක අරමුදලින් තැනැත්තෙකුට ලැබුණ යම් මුදලක්

ඒ) ශ්‍රී ලංකා රජය විසින් හෝ රජය වෙනුවෙන් නිකුත් කළ

(අ) දේශීය ව්‍යවහාර හෝ විදේශීය ව්‍යවහාර මුදල් වලින් වටිනාකම නියම කර ඇති ස්වෛරී බැඳුම්කර මත නිර්වාසික තැනැත්තෙකුට (ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් නොවන) උපචිත වන පොලී, වට්ටම් හෝ උපලබ්ධි වීමෙන් ලැබෙන ඕනෑම ලැබීමක්

(ආ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඇතුළු විදේශ ව්‍යවහාර මුදල්වලින් වටිනාකම නියම කර ඇති ඕනෑම ස්වෛරී බැඳුම්කරයක් මත අවස්ථාවෝචිත පරිදි ඕනෑම තැනැත්තෙකුට ගෙවන ලද හෝ ඉඩ දෙන ලද පොලිය හෝ වට්ටම්

එමගින් උපයන ලද ඕනෑම අදායමක්.

ඔ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද බැංකුවකින් හෝ රක්ෂණ සමාගමකින් වසර දහයකට නොඅඩු කාල සීමාවක් සඳහා මිලදී ගන්නා ලද ජීවිත රක්ෂණ වාර්ෂිකයක් මගින් ජ්‍යෂ්ඨ පුරවැසියෙකුට ව්‍යුත්පන්න වන යම් මුදල් ප්‍රමාණයක්

ඕ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ඇ.ඩො. මිලියන 100 කට නොඅඩු සමස්ත ආයෝජනයක් කරන ලද වාණිජ බැංකුවක් හෝ බලය ලත් වෙළෙන්දකුට ඒ බැඳුම්කර උපලබ්ධි කිරීමෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීමක්

ක) දළ මුදල් ප්‍රමාණය රු. 500,000 ක් නොඉක්මවන ලොතරැයියකින් හිමිවන යම් දිනුමක්

ග) ශ්‍රී ලංකා රජයේ සේවා නියුක්තයෙකුට නිකුත් කරන ලද මාර්ග වාහන බලපත්‍රයකින් එම සේවා නියුක්තයාට ලැබුණු හෝ ව්‍යුත්පන්න වූ ප්‍රතිලාභ

ච) දේශීය ආදායම් පනතේ 84 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ 2.5% බද්ද අඩු කරනු ලැබ ඇති යම් මැණිකක් විකිණීමෙන් යම් තැනැත්තෙකු උපයනු ලබන යම් මුදල් ප්‍රමාණයක්

ඡ) ගුවන් යානා, මෘදුකාංග බලපත්‍ර හෝ වෙනත් අදාළ සේවාවන් සඳහා වන යම් ගෙවීමක් ලෙස, සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් යම් නිර්වාසික තැනැත්තකු විසින් 2018 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව උපයන ලද යම් මුදලක්;

ට) රටට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව සැලකිල්ලට ගෙන ඒ ව්‍යාපෘතිය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නේ නම් සහ ඒ ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණයෙන් ම විදේශ ප්‍රදානවලින් අරමුදල් සැපයෙන්නේ නම්, ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘතියක යෙදී සිටින නිර්වාසික තැනැත්තකු විසින් උපයන ලද මුදල් ප්‍රමාණ;

ඩ) ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තෙකුට හෝ ශ්‍රී ලංකා රජයට ප්‍රදානය කර ඇති යම් ණයක් මත ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු විසින් උපයන හෝ උපචිත වන පොලිය

ත) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව යම් තැනැත්තෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වාණිජ බැංකුවක හෝ යම් විශේෂිත බැංකුවක විවෘත කරන ලද විදේශ ව්‍යවහාර ගිණුමක විදේශ ව්‍යවහාර මුදලින් ඔහුගේ බැරට ඇති මුදල් මත එම තැනැත්තාට උපචිත වන පොලිය

ද) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග මගින් නියම කර ඇති පරිදි, බලය ලත් වෙළෙන්දෙකු සමඟ, යම් නම් කරන ලද විදේශීය ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කර පවත්වාගෙන යනු ලබන (පසුව අලුත් කරන ලද ගිණුම් හැර) "විශේෂ තැන්පතු ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන කාලීන තැන්පතු ගිණුමකින් 2020 අප්‍රේල් මස 8 වන දින හෝ ඉන්පසුව යම් තැනැත්තෙකුට උපචිත වන හෝ ඒ තැනැත්තා විසින් උපයනු ලබන පොලිය

න) වාණිජ කේන්ද්‍ර මෙහෙයුම් වල නිරත වාසික සමාගම් විසින් ගෙවනු ලබන ලාභාංශ.

ම) ඕනෑම තැනැත්තෙකු යම් නිර්වාසික සමාගමක හරවත් සහභාගිත්වය සම්බන්ධයෙන් එම නිර්වාසික සමාගමෙන් ලැබුණු ලාභාංශ සහ කොටස් උපලබ්ධිවීමෙන් ලබන ලැබීම් **(**දේශීය අදායම් පනතේ තුන්වන උපලේඛනයේ (ඩ) ඡේදයේ හරවත් සහභාගිත්වය ලෙස අර්ථ දක්වා ඇති පරිදි)

ඇමුණුම 3 - සුදුසුකම් ලබන ගෙවීම්

අ) අනුමත පුණ්‍ය ආයතනයකට මුදලින් සිදු කළ පරිත්‍යාග - පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් හතරෙන් එකක ප්‍රමාණයක් (බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකක්) හෝ රු. 75,000 හෝ පරිත්‍යාග කළ ප්‍රමාණය යන ඒවායින් කවර හෝ අඩු අගය.

ආ) රජයට හෝ දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ සඳහන් නිශ්චිත ආයතනයකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද මුළු පරිත්‍යාග.

ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ කරන ලද පසුගිය තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද සුදුසුකම් ලබන ගෙවීම්වල අඩු නොකළ ශේෂයක්

ඈ) සමෘද්ධි ප්‍රතිලාභී පවුලක කාන්තාවකට වෙළඳසැලක් ස්ථාපනය කර ගැනීම සඳහා 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වාසික තැනැත්තෙකු විසින් මුදල් හෝ වෙනත් ආකාරයකින් සිදු කළ පරිත්‍යාගයක්,

(ඉ) 2021 අප්‍රේල් 01 වන දින හෝ එදිනට පසු යම් තැනැත්තෙකු විසින් දරන ලද පහත වියදම්,

i. රුපියල් මිලියන පහකට නොඅඩු පිරිවැයකින් චිත්‍රපටියක් නිෂ්පාදනය (එවැනි චිත්‍රපටියක ප්‍රවර්ධන වියදම් ඇතුළුව) කිරීම;

ii. රුපියල් මිලියන විසිපහකට නොවැඩි පිරිවැයකින් නව සිනමා ශාලාවක් ඉදිකිරීම සහ සූදානම් කිරීම;

iii. රුපියල් මිලියන දහයකට නොවැඩි පිරිවැයකින් සිනමා ශාලාවක් වැඩිදියුණු කිරීම

මෙම උපඡේදය යටතේ අඩු කිරීමේදී එය තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකකට සීමා විය යුතු අතර ප්‍රවර්තන වර්ෂයේ අඩු නොකළ යම් ප්‍රමාණයක් ඉදිරියට ගෙන යා හැකි අතර, පෙර පරිදිම සමාන සීමාවන් යටතේ ඉන් ඉක්බිතිව එළඹෙන වර්ෂයේ අඩු කළ හැකිය.

(ඊ) තනි පුද්ගලයෙකු හෝ අස්ථිත්වයක් විසින් ශ්‍රී ලංකා රජයට හෝ රජය විසින් පිහිටුවන ලද අරමුදලකට, මුදලින් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද පරිත්‍යාගයක් බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේ දී සුදුසුකම් ලබන ගෙවීමක් වශයෙන් අඩු කළ හැකි අතර, අදාළ තක්සේරු වර්ෂයේ සමස්ත තක්සේරු කළ හැකි ආදායමෙන් එය අඩු කළ පසුව ශේෂයක් වේ නම් එය ඊළඟ තක්සේරු වර්ෂයටද තවදුරටත් ශේෂයක් වේ නම් පසුව එළඹෙන තක්සේරු වර්ෂ සඳහා ඉදිරියට ගෙන යා හැකි ය. (මෙම සංශෝධනය 2025.04.01 වන දින සිට ක්‍රියාත්මක වේ.

ඇමුණුම 4 - අවසාන රඳවා ගැනීමේ ගෙවීම්, අවසාන නොවන රඳවා ගැනීමේ ගෙවීම් සහ අදාළ වන බදු අනුප්‍රමාණ

	ගෙවීම් වර්ගය	රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණ
(අ)	ඔට්ටු ඇල්ලීම හෝ සූදුවලින් සමන්විත ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී ලද මුදල් ප්‍රමාණ හැර ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදුවලින් දිනුම් ලෙස ගෙවන ලද මුදල් ප්‍රමාණ	14% අවසානාත්මක
(ආ)	**පොලී හැර රඳවා ගැනීමේ බද්දට යටත් නිර්වාසික තැනැත්තෙකු වෙත සිදු කරන ගෙවීම් (ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා**	14% අවසානාත්මක
(ඇ)	**නිර්වාසික තැනැත්තෙකුට ගෙවන ලද හෝ උපයනු ලැබූ ලෙස සලකනු ලබන පොලියක්**	10% අවසානාත්මක
(ඈ)	වෙන්දේසියේ විකුණන ලද යම් මැණිකක විකුණුම් මිල	2.5% නිදහස්
(ඉ)	පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ගෙවීම් කරන තැනැත්තාගේ සේවානියුක්තකයකු නොවන වාසික පුද්ගලයකුට සේවා ගාස්තු ගෙවීම ලිත් මාසයකට රු.100,000 ඉක්මවන විට- (අ) ඉගැන්වීම, දේශන පැවැත්වීම, විභාග පැවැත්වීම හෝ විභාගයක් සමීක්ෂණය හෝ අධීක්ෂණය කිරීම වෙනුවෙන් ; (ආ) වාසික රක්ෂණ අලෙවි හෝ ප්‍රචාරක නියෝජිතයකුට යම් කොමිස් මුදලක් හෝ තෑරැව් ගාස්තුවක් වශයෙන්; හෝ (ඇ) වෛද්‍යවරයකු, ඉංජිනේරුවරයකු, ගණකාධිකාරීවරයකු, නීතිඥයකු, මෘදුකාංග සංවර්ධකයකු, පර්යේෂකයකු, ශාස්ත්‍රඥයකු හෝ නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි යම් ස්වාධීන සේවා සපයන පුද්ගලයකු වැනි ස්වාධීන සේවා සපයන්නකුගේ තත්ත්වයෙන් ඒ පුද්ගලයා විසින් සපයනු ලබන සේවා වෙනුවෙන්.	සම්පූර්ණ ගෙවීම මත 5%
(ඊ)	ගෙවනු ලබන පොළිය හෝ වට්ටිමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී	10%
(උ)	යම් වාසික තැනැත්තකුට ගෙවනු ලබන කුලියක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී (මුළු මුදල ලිත් මාසයකට රු. 100,000 ඉක්මවන්නේ නම්)	සම්පූර්ණ ගෙවීම මත 10%
(ඌ)	අයකිරීම් ,ස්වාභාවික සම්පත් ගෙවුම් හෝ අධිමිල සම්බන්ධයෙන් වන අවස්ථාවක දී	14%
(එ)	රාජ්‍යභාග සම්බන්ධයෙන්	14%
(ඒ)	ලාභාංශ සම්බන්ධයෙන් (2023 ජනවාරි 01 වන දින හෝ එදිනට පසු යමු වාසික සමාගමක් විසින් ප්‍රකාශිත ලාභාංශ අවසානාත්මක රඳවා ගැනීමේ බද්දකි)	15% (අවසානාත්මක)

බදු අනුපාත

ඇමුණුම 5 - සහනදායී අනුප්‍රමාණ යටතේ බද්දට යටත් වන සේවාන්ත ප්‍රතිලාභ

i. විශ්‍රාම වැටුපක් පරිවර්තිත කිරීමේ දී ලැබූ මුදල් ප්‍රමාණ

ii. විශ්‍රාම පාරිතෝෂිකයක් වශයෙන් ලැබූ මුදල් ප්‍රමාණ

iii. සේවායෝජකයෙකු විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට එක සමානව අදාළ වන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන ක්‍රමයක් යටතේ ධූරය හෝ සේවා නියුක්තිය අහිමිවීම සම්බන්ධයෙන්, වන්දි මුදලක් ලෙස ලැබූ මුදල් ප්‍රමාණ

iv. යම් තැනැත්තෙකු සේවා නියුක්තියෙන් විශ්‍රාම ලැබූ අවස්ථාවේ දී හෝ ඊට පසු 1980 අංක 16 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතින් ස්ථාපිත සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් එම තැනැත්තාට ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණ

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත නොකරන ලද, සේවය අහිමි වීම වෙනුවෙන් ලැබුණු වන්දියක්, අර්ථසාධක අරමුදලින් ලැබුණු ගෙවීමක් (නියාමනය නොකරන ලද හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අනුමත නොකරන ලද අර්ථසාධක අරමුදල්), වෙනත් ගෙවීම් හෝ සේවාන්තයේ දී ලැබෙන මූදල් නොවන ප්‍රතිලාභ සාමාන්‍ය වැඩිවන අනුප්‍රමාණ යටතේ බද්දට යටත් වේ

ඇමුණුම 6 - සේවාන්ත ප්‍රතිලාභ සඳහා අදාළ වන සහනදායී බදු අනුප්‍රමාණ

සේවානියුක්තියෙන් ලද මුළු සේවාන්ත ප්‍රතිලාභ	බදු අනුප්‍රමාණය
පළමු රු. 10,000,000	0%
දෙවන රු. 10,000,000	6%
ශේෂය මත	12%

ඇමුණුම 7 - සාමාන්‍ය (වැඩිවන) බදු අනුප්‍රමාණ

(අ) 2024/2025 තක්සේරු වර්ෂයට අදාළ අනුප්‍රමාණ

	බදු අයකළ හැකි ආදායම	බදු අනුප්‍රමාණය

2025/2026 තක්සේරු වර්ෂය (2025 අප්‍රේල් 01 සිට 2026 මාර්තු 31 දක්වා)	පළමු - රු. 1,000,000 නොයික්මවන	6%
	දෙවන - රු. 1,000,000 ඉක්මවන නමුත් රු. 1,500,000 නොයික්මවන	18%
	තෙවන - රු. 1,500,000 ඉක්මවන නමුත් රු. 2,000,000 නොයික්මවන	24%
	සිව්වන - රු. 2,000,000 ඉක්මවන නමුත් රු. 2,500,000 නොයික්මවන	30%
	ශේෂය මත	36%

අනෙකුත් විශේෂ බදු අනුප්‍රමාණ

- ඔට්ටු සහ සූදු, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක්, නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය සහ විකිණීම සිදු කරන ව්‍යාපාරයක් (සිල්ලර වෙළඳාම හැර) - **45%**

- විදේශ ව්‍යවහාර මුදලින් ලැබී බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද විදේශ සේවා ආදායම සහ විදේශ මූලාශ්‍රගත ආදායම;

	බදු අයකළ හැකි ආදායම	**බදු අනුප්‍රමාණය**
2025/2026 තක්සේරු වර්ෂය (2025 අප්‍රේල් 01 සිට 2026 මාර්තු 31 දක්වා)	පළමු - රු. 1,000,000 නොයික්මවන	6%
	ශේෂය මත	15%

විශේෂ සටහන්

ඉහත මාර්ගෝපදේශයන්ට අමතරව, **www.ird.gov.lk** යන දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් කළින් කළට ආදායම් බදු සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුගමනය කිරීමට බදු ගෙවන්නන්හට මෙමඟින් උපදෙස් දෙනු ලැබේ.

වැඩිදුර තොරතුරු සඳහා

වැඩිදුර තොරතුරු සඳහා ලේකම් අංශයේ හෝ අදාළ ප්‍රාදේශිය කාර්යාලයේ නිලධාරීන් අමතන්න.

ප්‍රධාන කාර්යාලය	ලේකම් අංශය	0112135413 0112135430 0112135434 0112135438 0112135440 0112135441
	ව්‍යාපාර උපදේශන හා ප්‍රවර්ධන අංශය	0112134205 0112134274-80
නගරබද කාර්යාලය	කොළඹ නගර	0112504390
නගරබද කාර්යාලය	මැද කොළඹ	0112505274
නගරබද කාර්යාලය	කොළඹ දකුණ	0112502564
නවම් මාවත	1 සහ 2 අංශය	0112302249
ප්‍රාදේශිය කාර්යාලය	අනුරාධපුරය	0252235512
ප්‍රාදේශිය කාර්යාලය	බදුල්ල	0552222490
ප්‍රාදේශිය කාර්යාලය	මඩකලපුව	0652222087
ප්‍රාදේශිය කාර්යාලය	දඹුල්ල	0662283655
ප්‍රාදේශිය කාර්යාලය	ගාල්ල	0912222504
ප්‍රාදේශිය කාර්යාලය	ගම්පහ	0332234246
ප්‍රාදේශිය කාර්යාලය	යාපනය	0212222076
ප්‍රාදේශිය කාර්යාලය	කළුතර	0342222216
ප්‍රාදේශිය කාර්යාලය	මහනුවර	0812223590
ප්‍රාදේශිය කාර්යාලය	කෑගල්ල	0352222493
ප්‍රාදේශිය කාර්යාලය	කුරුණෑගල	0372222798
ප්‍රාදේශිය කාර්යාලය	මහරගම නැගෙනහිර	0112803127
ප්‍රාදේශිය කාර්යාලය	මහරගම බටහිර	0112803125
ප්‍රාදේශිය කාර්යාලය	මාතර	0412222933
ප්‍රාදේශිය කාර්යාලය	මීගමුව	0312228322
ප්‍රාදේශිය කාර්යාලය	නුවරඑළිය	0522222520
ප්‍රාදේශිය කාර්යාලය	රත්නපුර	0452222040

උදාහරණ

උදාහරණ 01:

යොහානි මහත්මිය රස මිහිර (පුද්ගලික) සමාගමේ ජ්‍යෙෂ්ඨ තත්ත්ව සහතික විධායක නිලධාරිනියකි. ඇයට සියලු දීමනා ඇතුළුව මාසික වැටුප ලෙස රු. 240,000.00 ක් ලැබේ. 2025/2026 තක්සේරු වර්ෂය තුළ ඇයට රු. 140,000.00 ක පොළී ආදායමක් ලැබුණි. (මූලාශ්‍රයෙන් රඳවා ගැනීමේ බද්ද 10% ක් අඩු කර ඇත). තවද, ඇය අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ලෙස රු.74,400 ක් ගෙවා ඇත (අ.පු.ආ.ඛ.)

2025/2026 තක්සේරු වර්ෂය සඳහා යොහානි මහත්මියගේ ආදායම් බදු බැදියාව ගණනය කිරීම.

		රු.
සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම	240,000 X 12	2,880,000
පොළී ආදායම		140,000
තක්සේරු කළ හැකි ආදායම		3,020,000
අඩු කළා: පුද්ගලික සහන		(1,800,000)
බදු අය කළ හැකි ආදායම		1,220,000
බද්ද ගණනය කිරීම	1,000,000 x 6%=60,000	99,600
අඩු කළා බදු බැර -අ.පු.ආ.ඛ. -පොළිය මත ර.ගැ.ඛ.		 (74,400) (14,000)
ගෙවිය යුතු බදු ශේෂය		11,200

උදාහරණය 02

චතුර මහතා දේශීය සහ විදේශීය ආයතන වෙත තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් පරිණාමන දේශන පවත්වනු ලබයි.

2025/2026 තක්සේරු වර්ෂය සඳහා චතුර මහතාගේ ආදායම පහත පරිදි වේ.

- දේශන ගාස්තු විදේශ රු.9,000,000(මූලාශ්‍ර රටේදී රදවා ගැනීමේ බද්ද 20% ක අනුප්‍රමාණයකින් අඩු කර ඇත)

- දේශීය ආයතනයන්ගෙන් ලද දේශන ගාස්තු රු.5,000,000 (අත්තිකාරම් ආදායම් බද්ද 5% ක අනුප්‍රමාණයකින් අඩු කර ඇත)
- ඉහත ආදායම් වියදම් සහ ප්‍රාග්ධන දීමනා අඩු කිරීමෙන් පසු අගයන් වේ
- තවද ඔහු කාර්තුමය බදු වශයෙන් රු 400,000 ක් ගෙවා ඇත.

ආදායම් බදු බැදියාව ගණනය කිරීම

ව්‍යාපාර ආදායම		
දේශන ගාස්තු විදේශ		9,000,000
දේශන ගාස්තු - දේශීය		5,000,000
තක්සේරු කළ හැකි ආදායම		**14,000,000**
අඩු කළා: සහන		
පුද්ගලික බදු සහන		(1,800,000)
බදු අය කළ හැකි ආදායම		**12,200,000**
බදු ගණනය කිරීම	විදේශ	දේශීය
	9,000,000x15%	1,000,000x6%=60,000 500,000x18%=90,000 500,000x24%=120,000 500,000x30%=150,000 700,000x36%=252,000
	1,350,000	672,000
අඩු කළා: බදු බැර		
විදේශ බදු බැර	1,350,000	-
අ.ආ.බ.	-	250,000
ඉහත බදු බැරවලින් පසු ගෙවිය යුතු බදු ශේෂය	0	422,000
වාරික ගෙවීම		400,000
ගෙවිය යුතු ශේෂය		**22,000**

සටහන - බලපත්‍රලාභී බැංකුවක් හරහා විදේශ මුදල් වලින් ලැබෙන විදේශ මූලාශ්‍ර ආදායම බද්දට යටත්වන අතර, විදේශ බදු බැර විදේශ මූලාශ්‍ර ආදායම සඳහා වන වගකීම් සඳහා සීමා වේ. එය වෙනත් කිසිදු බදු වගකීමකට එරෙහිව හිලව් කළ නොහැක. තවද, එය ආපසු ගෙවිය නොහැක.

උදාහරණය 3

අමිත් මහතා සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය ආහාර පිළිබඳ වීඩියෝ බ්ලොග් නිපදවන යූ ටියුබ්කරුවෙකි. ඔහුගේ ප්‍රේක්ෂක පිරිස, ශ්‍රී ලංකීය අනුගාමිකයන් ගෙන් සහ ජාත්‍යන්තර අනුගාමිකයන් යන දෙකොට්ඨාශයෙන් ම සමන්විත වේ. මෑතක දී ඔහුගේ ග්‍රාහකයින් සංඛ්‍යාව මිලියන 8 ට ළඟා විය.

2025/2026 නක්සේරු වර්ෂය සඳහා අමිත් මහතාගේ ආදායම පහත පරිදි වේ;

- යූ ටියුබ් සමාජ නාලිකාව තුළ ප්‍රචාරණය කිරීමෙන් -
  - දේශීය ප්‍රේක්ෂක පිරිසෙන් ලද ආදායම - රු 10,760,000
  - විදේශීය ප්‍රේක්ෂක පිරිසෙන් ලද ආදායම - රු 33,360,000

- අනුග්‍රාකත්වය සහ සන්නාම ප්‍රවර්ධනය මත ලද ආදායම
  - දේශීය - රු 28,840,000
  - විදේශීය - රු 49,920,000

ඉහත ආදායම් වියදම් සහ ප්‍රාග්ධන දීමනා අඩු කිරීමෙන් පසු අගයන් වේ.

ඔහුට විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රේෂණය කරන ලද ආදායම ලංකා බැංකුව හරහා ලැබුණි.

- ඔහු ශ්‍රී ලංකාවේ හෝටල් පාසැල් සඳහා බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය ලබාදීම මගින් රු 890,000ක් උපයා ගත්තේ ය. (5% ක අ.ආ.බ. අඩු කර ඇත)
- ඔහු සිය ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ පාසැලේ (රජයේ පාසැලකි.) උදෑසන ආහාර වැඩසටහනට රු 2,500,000ක් වටිනා ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කළේ ය.
- තවද ඔහු කාර්තුමය බදු වශයෙන් රු 8,160,000ක් ගෙවා ඇත.

ආදායම් බදු බැදියාව ගණනය කිරීම

		රු.
සේවා නියුක්ත ආදායම		-
ව්‍යාපාරික ආදායම		
දේශීය ප්‍රේක්ෂක ප්‍රජාව		
- යූ ටියුබ් සමාජ නාලිකාව තුළින් ලද ප්‍රචාරණ ආදායම		10,760,000
- අනුග්‍රාකත්වය සහ සන්නාම ප්‍රවර්ධනය මත ලද ආදායම		28,840,000
විදේශීය ප්‍රේක්ෂක පිරිස		
- යූ ටියුබ් සමාජ නාලිකාව තුළින් ලද ප්‍රචාරණ ආදායම		33,360,000
- අනුග්‍රාකත්වය සහ සන්නාම ප්‍රවර්ධනය මත ලද ආදායම		49,920,000
දේශන පැවැත්වීමෙන් ලද ආදායම		890,000
තක්සේරු කළ හැකි ආදායම		**123,770,000**
අඩු කළා - සහන		
පුද්ගලික සහන		(1,800,000)
අඩු කළා - සුදුසුකම් ලබන ගෙවීම්		
රජයේ පාසැලට කළ පරිත්‍යාග		(2,500,000)
බදු අය කළ හැකි ආදායම	විදේශ මූලාශ්‍ර	83,280,000
	දේශීය මූලාශ්‍ර	36,190,000
විදේශ ප්‍රේක්ෂකයන්ගෙන් ලද ආදායම මත බදු බැදියාව	83,280,000 x 15%	12,492,000
දේශීය ප්‍රභවයෙන් ලැබූ දේශන ආදායම මත බදු බැදියාව	1,000,000 x 6% 500,000 x 18% 500,000 x 24% 500,000 x 30%	60,000 90,000 120,000 150,000

	34,690,000 x 36%	12,128,400
2025/2026 සඳහා ගෙවිය යුතු මුළු බදු මුදල		25,040,400
අඩු කළා - බදු බැර • දේශන ගාස්තු මත අ.ආ.බ • වාරික ගෙවීම්		 (44,500) (8,160,000)
ගෙවිය යුතු බදු ශේෂය		**16,835,900**

***සටහන** - පුද්ගලික බදු සහන (PTR) සහ සුදුසුකම් ලබන ගෙවීම් (Q/P), විදේශ සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමෙන් හෝ දේශීය සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමෙන් / ව්‍යාපාරික ආදායමෙන් / ආයෝජන ආදායමෙන් හෝ වෙනත් බදු අය කළ හැකි ආදායමකින් යන කුමකින් හෝ අඩු කළ හැකි ය.

උදාහරණය 4

රේණුකා හෙට්ටිආරච්චි මහත්මිය ව්‍යාපාරික කාන්තාවක් හා BOP සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වේ. 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඇයගේ ආදායම පහත පරිදි වේ;

- සේවානියුක්ති ආදායම රු. 7,500,000
- ව්‍යාපාර ආදායම රු. 11,500,000 කි.(ඉඩදිය හැකි වියදම් අඩු කිරීමෙන් පසු)
- ස්ථාවර තැන්පතුවලින් ලැබෙන දළ පොලී ආදායම රු. 8,000,000 (10% ක අනුප්‍රමාණයක දී රඳවා ගැනීමේ බද්ද අඩු කර ඇත)
- කුලී ආදායම රු. 1,900,000කි. (අත්තිකාරම් ආදායම් බද්ද 10% ක අනුප්‍රමාණයකින් අඩු කර ඇත.)
- සූර්ය පැනල සවි කර 2025.04.01 සිට 2026.03.31 දක්වා ජාතික විදුලිබල පද්ධතියට විදුලිය සැපයීමෙන් ලද ආදායම රු. 240,000කි. (ප්‍රාග්ධන දීමනා අඩු කිරීමෙන් පසු)

සේවානියුක්ති ආදායමට මූදල් සහ මූදල් නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ. ඇය දිස්ත්‍රික් රෝහලට නව උපකරණ මිල දී ගැනීම සඳහා රු. 1,000,000 ක් ප්‍රදානය කර ඇත. මීට අමතරව ඇය මෙම ත/ව තුළ සමෘද්ධි ප්‍රතිලාභී පවුලක කාන්තාවකට වෙළඳසැලක් ස්ථාපනය කිරීම සඳහා රු. 800,000 ක මුදලක් දරා ඇත. (මුදලින් රු. 500,000 ක් ද ද්‍රව්‍යමය ලෙස - සිමෙන්ති සැපයීමට රු. 300,000 ක් ද) එමෙන්ම 2022.08.01 වන දින රේණුකා මහත්මිය විසින් රු. මි. 2,000,000 ක පිරිවැයක් දරා ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධිතව සූර්ය පැනල ද තම නිවෙස් පරිශ්‍රයේ සවි කර ඇති අතර ඇය දැනටමත් එක් වර්ෂයකට රු. 600,000 බැගින් පසුගිය තක්සේරු වර්ෂ තුන (03) තුළ රු. 1,800,000ක් සුදුසුකම් ලබන ගෙවීම් වශයෙන් අඩු කර ඇත.

2025/2026 තක්සේරු වර්ෂය සඳහා රේණුකා මහත්මියගේ බදු බැඳියාව ගණනය කිරීම පහත පරිදි වේ.

ආදායම් බදු බැඳියාව ගණනය කිරීම

		රු.
සේවානියුක්ති ආදායම		7,500,000
ව්‍යාපාර ආදායම සූර්ය පැනල මඟින් විදුලි බලය ලබා දීමෙන් ලැබෙන ව්‍යාපාර ආදායම		11,500,000 240,000
ආයෝජන ආදායම • පොළී ආදායම • කුලී ආදායම		 8,000,000 1,900,000
තක්සේරු කළ හැකි ආදායම		**29,140,000**
අඩු කිරීම් - සහන		
• කුලී සහන		(475,000)
• පුද්ගල සහනය		(1,800,000)
• සූර්ය පැනල සවි කිරීම	රු. 200,000ක ශේෂයක් පමණි)	(200,000)
අඩු කිරීම් – සුදුසුකම් ලබන ගෙවීම්		
• කරන ලද ප්‍රදාන • සමෘද්ධි කාන්තාවකට වෙළඳසැලක් ස්ථාපනයට	 මුදලින් 500,000/- සිමෙන්ති 300,000/-	(1,000,000) (800,000)
බදු අය කළ හැකි ආදායම		**24,865,000**
බදු බැඳියාව	1,000,000 x 6% = 60,000	
	500,000 x 18% = 90,000	
	500,000 x 24% = 120,000	
	500,000 x 30% = 150,000	
මුළු බදු බැඳියාව	ඉතිරිය - 22,365,000 x 36% = 8,051,000	**8,471,400**
අඩු කළා - බදු බැර අ.පු.ආ.බ		 1,571,316

පොළිය මත ර.ඛ. කුලිය මත අ.ආ.ඛ.		800,000 190,000
ගෙවිය යුතු ඉනිරි බද්ද (2025/2026)		**5,910,084**

උදාහරණය 5

මහාචාර්ය දිමිත්ත්‍රි මහතා ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට අනුයුක්තව සේවය කරයි. ඒ සමඟම ඔහු NARA ආයතනය සඳහා උපදේශකවරයකු වශයෙන් සේවය සපයනු ලබන අතර අළුත් කරන ලද එම සේවය සඳහා ඔහුට මාසික පදනම මත ගෙවීමක් ලැබේ. 2025/2026 තක්සේරු වර්ෂය සඳහා මහාචාර්ය දිමිත්‍රිගේ ආදායම පහත පරිදි වේ;

- ඉංජිනේරු පීඨයෙන් ලැබෙන සේවානියුක්තිය මත ලබන ආදායම (ප්‍රාථමික සේවා නියුක්තිය) - රු. 9,000,000
- NARA ආයතනයෙන් ලබන උපදේශන ගාස්තු ආදායම (ද්විතියික සේවා නියුක්තිය) - 2025.04.01 දින සිට 2026.01.31 දින දක්වා රු. 5,000,000
- දළ පොලී ආදායම රු. 4,500,.000. (10% ක අනුප්‍රමාණයකින් අ.ආ.ඛ. අඩුකර ඇත.)
- ගෙවල් කුලී ආදායම රු. 1,800,000 (ව්‍යාපාරයක් සඳහා කුලියට ලබා දී ඇති වාණිජ ගොඩනැගිල්ලෙන්)
- සූර්ය පැනල සවි කර 2025.04.01 සිට 2026.03.31 දක්වා ජාතික විදුලිබල පද්ධතියට විදුලිය සැපයීමෙන් ලද (වෙනත්) ආදායම රු. 360,000/- (ප්‍රාග්ධන දීමනා අඩු කිරීමෙන් පසු)
- 2026 පෙබරවාරි මාසයේ වාසික සමාගමකින් ලද ලාභාංශ ආදායම රු. 500,000ක් වේ. (ගෙවීම 15% ක අවසාන රඳවා ගැනීමේ බදු අඩු කිරීමකට යටත් විය.)

සේවානියුක්තියෙන් ලැබෙන ආදායමට මුදල් සහ මුදල් නොවන ප්‍රතිලාභ ඇතුළත් වේ. පසුගිය ත/ව තුළ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධිතව තම නේවාසික පරිශ්‍රය සඳහා සූර්ය පැනල සවි කිරීමට රු. 1,000,000 වියදම් කළේය. ඔහු ළමුන් සඳහා පරිගණක ඒකකයක් ස්ථාපනය කිරීමට බොගවන්තාන මහ විද්‍යාලය (රජයේ පාසලකි) වෙත රු. 250,000ක් ප්‍රදානය කළේය. තවද, ඔහු මෙම වර්ෂය තුළ අනුමත පුණ්‍යායතනයක් සඳහා රු. 200,000ක් ප්‍රදානය කළේය.

		රු.
සේවානියුක්ති ආදායම		
ප්‍රාථමික සේවා නියුක්තිය		9,000,000
ද්විතියික සේවා නියුක්තිය		5,000,000
ව්‍යාපාර ආදායම		
සූර්ය පැනල මඟින් විදුලි බලය සැපයීමෙන් ලද ආදායම		360,000
ආයෝජන ආදායම		
කුලී ආදායම		1,800,000
පොළී ආදායම		4,500,000
තක්සේරු කළ හැකි ආදායම		**20,660,000**
අඩු කිරීම් - සහන		
• කුලී සහන		(450,000)
• ඉ/ගෙ සූර්ය පැනල සවි කිරීම් සහන		(400,000)
• පුද්ගල සහනය		(1,800,000)
අඩු කිරීම් – සුදුසුකම් ලබන ගෙවීම්		
• අනුමත පුණ්‍යායතනයට කළ ප්‍රදානය		(75,000)
• රජයේ පාසලට කරන ලද ප්‍රදාන		(250,000)
බදු අය කළ හැකි ආදායම		**17,685,000**
බදු බැඳියාව	1,000,000 x 6% = 60,000	
	500,000 x 18% = 90,000	
	500,000 x 24% = 120,000	
	500,000 x 30% = 150,000	

	15,185,000 x 36% = 5,466,600	
ගෙවිය යුතු මුළු බද්ද (2025/2026)		**5,886,600**
අඩු කළා - බදු බැර		
- අ.පු.ආ.බ		3,912,000
- පොළිය මත අ.ආ.බ		450,000
- කුලිය මත 10% අනුප්‍රමාණයකින් අ.ආ..බ.		180,000
- කාර්තුමය ගෙවීම්		800,000
ගෙවිය යුතු ඉතිරි බද්ද		**544,600**

ආදායම් බදු බැඳියාව ගණනය කිරීම

***සටහන** -ලාභාංශ ආදායම- අවසානාත්මක රඳවා ගැනීමේ බද්දට යටත් වී ඇති බැවින් තක්සේරු කළ හැකි ආදායමේ කොටසක් නොවේ.

උදාහරණය 06

හසිත පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයෙකු වන අතර එක්සත් ජනපදයේ ස්ථාපිත සමාගමක මෘදුකාංග ඉන්ජිනේරුවකු වශයෙන් සේවයේ නියුක්තව සිටී. ඔහු සිය සියළුම රාජකාරී කටයුතු ශ්‍රී ලංකාවේ පිහිටි තම වාසස්ථානයේ සිට ඉටු කරයි. හසිත මහතා විසින් සකස් කරනු ලබන මෘදුකාංග යෙදුම් යුරෝපීය සංගමයේ රටවල අලෙවි කරනු ලබන අතර එම රටවල පාරිභෝගිකයින් විසින් භාවිත කරනු ලැබේ. එක්සත් ජනපද සමාගම සමග එළඹී ගිවිසුමට අනුව, ඔහුගේ මාසික වැටුප එක්සත් ජනපද ඩොලර්වලින් ලැබෙන අතර එය ඔහුට ලංකා බැංකුවේ පවත්වාගෙන යන විදේශ මුදල් ගිණුම හරහා ප්‍රේෂණය කරනු ලැබේ. මෙම තක්සේරු වර්ෂය තුළ ඔහුට එම වැටුප අඛණ්ඩව සම්පූර්ණ මාස 12 සඳහා ම ලැබුණි.

2025/2026 තක්සේරු වර්ෂය සඳහා හසිත මහතාගේ ආදායම පහත පරිදි වේ.

- එක්සත් ජනපද සමාගමේ සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම - රු 16,380,000 (එක්සත් ජනපද ඩොලර් ශ්‍රී ලංකා රුපියල්වල පරිවර්තනය කිරීමෙන් පසු)
- මහජන බැංකුවේ රුපියල්වලින් පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතුව සඳහා ලැබෙන දළ පොළී ආදායම රු 3,600,000 (අත්තිකාරම් ආදායම් බද්ද ලෙස 10%ක් අඩු කර ඇත.)

- කුලී ආදායම රු 1.080,000 (ඔහු වාසය කරන නිවසේ උඩුමහල කුලියට දීමෙන්)
- ඔහු ශ්‍රී ලංකාවේ SOS ළමා ගම්මානයට රු 200,000ක් පරිත්‍යාග කර ඇත.
- ඔහු කාර්තුමය බදු වශයෙන් රු 365,000ක් ගෙවා ඇත.
- බදු චක්‍ර 08 අනුව ඔහු ගෙවූ බදු මුදල් ප්‍රමාණය (අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද) රු 2,142,000 වේ.

		රු.
සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම (වියදම් අඩු කිරීමට ඉඩ ලබා නොදේ)		16,380,000
පොළී ආදායම		3,600,000
කුලී ආදායම		1,080,000
තක්සේරු කළ හැකි ආදායම		**21,060,000**
අඩු කළා - සහන		
කුලී සහන		(270,000)
පුද්ගලික සහන		(1,800,000)
අඩු කළා - සුදුසුකම් ලබන ගෙවීම්		
SOS ගම්මානයට කළ පරිත්‍යාග	අනුමත පුණ්‍යායතන	(75,000)
බදු අය කළ හැකි ආදායම		**18,915,000**
විදේශ සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා බදු බැඳියාව	16,380,000 x 15%	2,457,000
කුලී සහ පොළී ආදායම් සඳහා බදු බැඳියාව	1,000,000 x 6% 500,000 x 18% 500,000 x 24% 500,000 x 30% 35,000 x 36%	60,000 90,000 120,000 150,000 12,600
2025/2026 සඳහා ගෙවිය යුතු මුළු බද්ද		**2,889,600**

අඩු කළා - බදු බැර		
• අ.පු.ආ.බ.		(2,142,000)
• පොළිය මත අ.ආ.බ.		(360,000)
• කාර්තුමය ගෙවීම		(365,000)
ගෙවිය යුතු බදු ශේෂය		**22,000**

ආදායම් බදු බැඳියාව ගණනය කිරීම

වෙනත් කරුණු

*පෞද්ගලික බදු සහන (PTR) සහ සුදුසුකම් ලබන ගෙවීම් (Q/P), විදේශ සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමෙන් හෝ දේශීය සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමෙන්/ව්‍යාපාරික ආදායමෙන්/ආයෝජන ආදායමෙන් හෝ වෙනත් බදු අය කළ හැකි ආදායමකින් යන කුමකින් හෝ අඩු කළ හැකි ය.

අතිරේක සටහන් -

- විදේශ සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම මත අ.පු.ආ.බ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බදු චක්‍ර 8 අනුව අඩු කළ යුතු ය.

- බලපත්‍රලාභී බැංකුවක් හරහා විදේශ මුදල් වලින් ලැබෙන විදේශ මූලාශ්‍ර ආදායම බද්දට යටත්වන අතර, විදේශ බදු බැර විදේශ මූලාශ්‍ර ආදායම සඳහා වන වගකීම් සඳහා සීමා වේ. එය වෙනත් කිසිදු බදු වගකීමකට එරෙහිව හිලව් කළ නොහැක. තවද, එය ආපසු ගෙවිය නොහැක.